“Where only innovation matters”

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

# 2022




## ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය
## தேசிய புத்தாக்க முகவராண்மை
## National Innovation Agency

NATIONAL INNOVATION AGENCY SRI LANKA

*"අදාළ වන්නේ නව්‍යකරණය ම පමණකි"*

# වාර්ෂික වාර්තාව 2022


ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය
තෙවන මහල, සෙත්සිරිපාය අදියර I,
බත්තරමුල්ල
**දුරකථන: 011 -3661201 /-3661205**
**ෆැක්ස්: 0112875935**
**විද්‍යුත් තැපැල: info@nia.gov.lk**
**වෙබ්: www.nia.gov.lk**


**සමාජ මාධ්‍ය**

ට්විටර්: @NationalInnova2

**LinkedIn: National Innovation Agency Sri Lanka**

**Facebook: National Innovation Agency - Sri Lanka**

**YouTube: National Innovation Agency (NIA) - Sri Lanka**
**https://www.youtube.com/channel/UCzh8_4WJN3EyN8RbIJSDSlQ**

**අන්තර්ගතය** **පිටු අංක:**


ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

**දැක්ම, මෙහෙවර සහ හැඳින්වීම** **4**

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයෙහි අරමුණු** **5**

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයෙහි කාර්යභාරය** **6**

**සභාපතිතුමාගේ පණිවුඩය** **8**

**ප්‍රධාන නවයකරණ නිලධාරී සමාලෝචනය** **9**

**පරිපාලන රාමුව**

**පාලක සභාවේ කෙටි පැතිකඩ** **13**

**සංවිධාන ව්‍යුහය** **14**

**කාර්ය මණ්ඩලය** **15**

**2022 ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රතිදානය/ප්‍රතිඵල පදනම් කරගත් කාර්ය සාධන සමාලෝචනය 16**

විගණිත මූල්‍ය වාර්තාව **38**

**විගණකාධිපති වාර්තාව** **48**

විගණකාධිපති වාර්තාවට ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ **ප්‍රතිචාරය** **54**




## ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) 2019 අංක 22 දරන පනත මගින් නියම කර ඇති පරිදි ස්ථාපිත කරන ලද්දේ සමාජ, විද්‍යා සහ තාක්ෂණ, ආරක්ෂක, පරිසරය සහ සේවා යන ක්ෂේත්‍රවල නවෝත්පාදනයන් සහ රටේ ආර්ථිකය කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමේ නිශ්චිත අරමුණ ඇතිවය.

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) යනු උසස් අධ්‍යාපන ආයතන, විද්‍යා සභා, රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය සහ වාණිජකරණය අතර නවෝත්පාදන පරතරය තුරන් කිරීම සඳහා ප්‍රධාන ආයතනික මැදිහත්වීමක් ලෙස සේවය කරන ජාතික මහජන ආයතනයකි. වෙනත් වචන වලින් කිවහොත්, එහි පරමාර්ථය වන්නේ කර්මාන්ත, අධ්‍යයන අංශ සහ රජය අතර සමීප සහයෝගීතාවයෙන් මෙහෙයැවෙන නවෝත්පාදනයන් වේගවත් කිරීම සහ අංශ තුනම අතර සංවාදය සඳහා වේදිකාවක් මගින් පහසුකම් සැලසීමයි. 'නවෝත්පාදනය' යනු අදාළ දේ නිර්මාණාත්මකව හා ආර්ථික වශයෙන් සිදු කිරීමට සැලැස්වීම වන අතර එය විද්‍යාවට පමණක් සීමා නොවන බවට වැදගත් උදාහරණ වනුයේ රාජ්‍ය අංශයේ නවෝත්පාදන, සමාජීය නවෝත්පාදන, අරපිරිමැසුම් නවෝත්පාදන, විවෘත නවෝත්පාදන ආදිය යි.

නවෝත්පාදන ක්‍රියාවලිය සැබවින්ම සිදු වන බව සහතික කිරීම සඳහා මෙය තිරස්- ආයතනිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබිය යුතුය. කඩිනම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය ද සිය කළමනාකරණ ක්‍රියාවලියේ ද නවෝත්පාදනයන් කළ යුතු අතර එනයින් රාජ්‍ය අංශයේ සේවා නවෝත්පාදනය ද වැදගත් අංගයක් වනු ඇත.

ශ්‍රී ලංකාව සිය ජනතාවට සමෘද්ධිය ගෙන ඒමට සහ ගෝලීය නවෝත්පාදන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත වීමට නම්, NIA කර්මාන්ත, තාක්ෂණය, මූල්‍ය හෝ ආයෝජන සහ අධ්‍යාපනය වැනි විවිධ ක්ෂේත්‍ර වලින් විවිධ සංවිධාන සම්බන්ධීකරණය, ජාලකරණය සහ හවුල්කාරිත්වය සඳහා මූලික ආයතනයක් ලෙස ක්‍රියා

කරනු ඇති අතර, විශේෂයෙන් ජීවිතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ප්‍රධාන මෙවලමක් ලෙස තරගකාරී ආර්ථිකයන් සඳහා යොමු කෙරෙන මෙවලමක් ලෙස නව්‍යකරණ භාවිතා කරන "පොකුරු වේදිකාවේ නව්‍යකරණ" ඇති කිරීම සඳහා නව්‍යකරණ භාවිත කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පාලනය කරනු ලබන්නේ අන්තර් අමාත්‍යාංශ ව්‍යුහයක් ඇති සහ ජනාධිපති ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් පාලක සභාවක් විසිනි. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තනි නව්‍යකාරකයන්/ව්‍යවසායකයින්ගෙන් සහ තනතුරු බලයෙන් පත්වන ස්ථිර සාමාජිකයන්ගෙන් සමන්විත වේ.


PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

NATIONAL INNOVATION AGENCY ACT, No. 22 OF 2019

[Certified on 15th of November, 2019]

*Printed on the Order of Government*

Published as a Supplement to Part II of the **Gazette of the Democratic Socialist Republic of Sri Lanka** of November 15, 2019




## 2019 අංක 22 දරන පනත මගින් පවරා ඇති පරිදි නියෝජිතායතනයේ අරමුණු

- ආර්ථිකයට බලපෑමක් ඇති කිරීම සඳහා සමාජ නව්‍යකරණය, විද්‍යා සහ තාක්ෂණ නව්‍යකරණය, ආරක්ෂක නව්‍යකරණය, පරිසර නව්‍යකරණය සහ සේවා නව්‍යකරණයන් මත කටයුතු කිරීම;
- නව්‍යකරණයන් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම;
- ජාතික පර්යේෂණ ආර්ථිකයට දායක වීම සහ ඊට සමපාත වීම සහතික කිරීම;
- බලපෑම පෝෂණය කිරීම සඳහා නවෝත්පාදකයින් සහ මූලපිරීම් සම්බන්ධීකරණය කිරීම;
- නව්‍යකරණයට බාධා කරන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඕනෑම බාධාවක් හඳුනා ගැනීම;
- පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් විචිත්‍රවත් ජාතික නව්‍යකරණ පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීම.

**නියෝජිතායතනයේ කාර්යභාරය හා ක්‍රියාවන් වනුයේ: –**

(අ) නියෝජිතායතනයේ අරමුණුවල වැදගත් කාරණාවලට අදාළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය;

(ආ) උත්පාදක ආර්ථිකයකට සහාය ලබාදීම සඳහා ජාතික නවාකරණ වැඩසටහන් ආරම්භ කිරීම සහ ඊට අරමුදල් සැපයීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා නවාකරණ හා ව්‍යවසායකත්ව උපාය මාර්ගයට අනුකූලව ජාතික නවාකරණ පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම හා පවත්වා ගැනීම;

(ඈ) පර්යේෂණ හා තාක්‍ෂණ හුවමාරුවෙන් ඇතිවන අධි තාක්‍ෂණික ව්‍යාපාර සඳහා පහසුකම් සැපයීම හරහා ජාතික නවාකරණ හා ව්‍යවසායකත්ව උපායමාර්ග අරමුණු සඳහා සහාය වීම;

(ඉ) නවාකරණයන් සහ ව්‍යවසායකත්වය පිළිබඳ ආයෝජන, ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවල සඵලදායීතාවය අධීක්ෂණය කිරීම සහ ඇගයීම;

(ඊ) නවාකරණ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල වාණිජකරණය කිරීම දිරිමත් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් නවාකරණ ආයතන සමඟ සහ ජාත්‍යන්තර ආයතන සමඟ නවාකරණයේ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ සමගාමී කිරීම;

(උ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා නවාකරණ හා ව්‍යවසායකත්ව උපාය මාර්ගයට යටත්ව ප්‍රත්‍යස්ථිත ආර්ථික ස්ථාවරත්වයක් සහතික කිරීම සඳහා ගෝලීය නවාකරණ දර්ශක ශ්‍රේණිගත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය ඉහළ නැංවීම;

(ඌ) ජාත්‍යන්තර සම්බන්ධතාවය සහ අභිමුඛභාවය සැලකිල්ලට ගනිමින් පරිසර පද්ධතිය ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ වාර්ෂික නවාකරණ සහ ව්‍යවසායකත්ව වාර්තා ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම, ඇගයීම සහ පළ කිරීම;

(එ) නියෝජිතායතනයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ ආකල්පයක් ඇතිව යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි නියෝජිතායතනය සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, නියෝජිතායතනය සතු යම් චංචල හෝ නිශ්චල දේපළ දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබා දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඒ) අදාළ වන්නා වූ යම් ලිඛිත නීතියකට යටත්ව, යම් රාජ්‍ය බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් තැන්පතු ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම සහ එම ගිණුම් වසා දැමීම;

(ඔ) අදාළ වන්නා වූ යම් ලිඛිත නීතියකට යටත්ව, නියෝජිතායතනයේ භාවිතය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත මූලාශ්‍රවලින් ලැබෙන නිශ්චල සහ චංචල ත්‍යාග, ප්‍රදාන, ණය, පරිත්‍යාග සහ රික්තාවරණ භාරගැනීම සහ ලබා ගැනීම: එසේ වුව ද, නියෝජිතායතනය වෙත ලැබෙන සියලුම විදේශ ප්‍රදාන, පරිත්‍යාග හෝ රික්තාවරණ වෙනුවෙන් නියෝජිතායතනය විසින් මුදල් අමාත්‍යාංශයේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඕ) නියෝජිතායතනයේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන නියෝජිතායතනයේ අරමුදල් නියෝජිතායතනයේ ඕනෑම බැංකු ගිණුමක හෝ ගිණුම්වල තැන්පත් කිරීම;

(ක) නියෝජිතායතනයේ කටයුතු පරිපාලනය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම;

(ග) අදාළ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කරනු ලබන යෝග්‍ය ගෙවීම් සඳහා නියෝජිතායතනයේ කාර්යය සහ කර්තව්‍යය සුමට ලෙස සහ කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පර්යේෂණ, දත්ත එක්රැස් කිරීම හෝ වෙනත් යම් කටයුතු, බැහැරින් ලබා ගැනීම, මේ පනතේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් සිදුකරන සියලු පර්යේෂණ, එකතු කරන ලද යම් ද්‍රව්‍ය හෝ දත්තවල හිමිකාරිත්වය නියෝජිතායතනය සතු විය යුතු අතර, එම පර්යේෂණ, ද්‍රව්‍ය හෝ දත්ත ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතු ය;

(ච) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, නියෝජිතායතනයේ අරමුණු සම්බන්ධයෙන් යම් දේශීය හෝ විදේශීය තැනැත්තන් හෝ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ජ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, නියෝජිතායතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පෞද්ගලික අංශය සමග බද්ධ ව්‍යාපාර සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම; සහ

(ට) සාමාන්‍යයෙන්, නියෝජිතායතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම.

**සභාපතිතුමා ගෙන්**



ශ්‍රී ලංකාවේ ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ (NIA) 2022 වාර්ෂික වාර්තාව සඳහා මගේ පණිවිඩය ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. පසුගිය වසර පිළිබිඹු කරන විට, ශ්‍රී ලංකාවේ නවායකරණයන් පෝෂණය කිරීම සහ නවායකරණ ක්ෂේත්‍රයේ ධනාත්මක වෙනසක් ඇති කිරීම සම්බන්ධයෙන් NIA සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බව මා පවසන්නේ ආඩම්බරයෙනි.

රට තුළ ආරම්භක හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ආධාරක වේදිකාවක් නිර්මාණය කිරීමට NIA දායක වී ඇත. මෙම ව්‍යවසායක ව්‍යාපාර ආර්ථික වර්ධනයේ යන්ත්‍ර බව අපගේ දැඩි විශ්වාසය වන බැවින්, අපේක්ෂා කරන ව්‍යවසායකයින්ට ඔවුන්ගේ අදහස් ශක්‍ය ව්‍යාපාර බවට පත් කිරීමට සහාය වීම සඳහා උපදේශනය පිරිනැමීමට අපි වැඩසටහන් රාශියක් දියත් කර ඇත්තෙමු. අප විසින් පහසුකම් සලසා ඇති ආරම්භක ව්‍යාපාරවල සාර්ථකත්වය පිළිබඳ පුවත් ශ්‍රී ලාංකේය ව්‍යවසායකයින්ගේ ප්‍රයෝජනයට නොගත් හැකියාව පිළිබඳ සාක්ෂි දරයි.

නවායකරණය මෙහෙයවීමට සහ ශ්‍රී ලංකාව සෞභාග්‍යමත් අනාගතයක් කරා මෙහෙයවීමට NIA සිය කැපවීමෙහි ස්ථිරව පිහිටා පෙරමග බලයි. අප මුහුණ දෙන අභියෝග සංකීර්ණ වන අතර නවායකරණයේ මාවත බාධාවලින් තොර නොවන බව අපි දනිමු. කෙසේ වෙතත්, සහයෝගීතාවය පෝෂණය කිරීම, විවිධත්වය වැළඳ ගැනීම සහ අදහස්වල බලය සඳහා ආයෝජනය කිරීමෙන් අපට ඕනෑම බාධකයක් ජය ගත හැකි බව හා අපගේ ජාතියේ පූර්ණ විභවයේ අගුළු හැරිය හැකි බව අපි දැඩි ලෙස විශ්වාස කරමු.

ශ්‍රී ලංකාව තුළ නවායකරණයට සාර්ථකව පහසුකම් සැලසීමට සිය උනන්දුව, දැනුම හා වෙහෙස මහන්සියෙන් දායක වන, කැපවීමෙන් ක්‍රියාකරන NIA කණ්ඩායමට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අපව තවදුරටත් ශක්තිමත් කරන අපගේ අමිල වගකීම් දරන්නන්, පාර්ශ්වකරුවන්, සහ පාලක සභාවේ සාමාජිකයින්ට ද මම ස්තූතිවන්ත වෙමි.

තිරසාර සංවර්ධනය, ආර්ථික සමෘද්ධිය සහ සැමට යහපත් අනාගතයක් උදෙසා ශ්‍රී ලංකාව දිරිමත් කරන නවායකරණ පරිසර පද්ධතියක් අපි එක්ව අඛණ්ඩව පෝෂණය කරමු.

ස්තුතියි.

**ඊ.එම්.එස්.බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්
සභාපති, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය - ශ්‍රී ලංකාව
ජූනි 9, 2023

## ප්‍රධාන නව්‍යකරණ නිලධාරී **සමාලෝචනය**



### ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයක් **බිහි වෙයි!**


ආයතනයක් ලෙස සිය පළමු වසර විදහා දක්වන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ මෙම පළමු වාර්ෂික වාර්තාව අප විසින් ප්‍රකාශයට පත් කරන්නේ ආඩම්බරයෙන් සහ නිහතමානීව ය. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව 2021 නොවැම්බර් 29 වැනි දින සමාරම්භක පාලක සභා රැස්වීමෙන් පසු 2022 ජනවාරි 01 දින ආයතනය සිය මෙහෙයුම් ආරම්භ කළේ ය. ඇත්ත වශයෙන්ම, මෙම තත්ත්වයට ආ ගමන බොහෝ සාකච්ඡා සහ කැබිනට් රැස්වීම් හරහා සිදු විය. NIA යනු එක්තරා ආකාරයකින්, මහාචාර්ය තිස්ස විතාරණ මහතා යටතේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලයය විසින් සංවර්ධනය කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන COSTI හි (විද්‍යා, තාක් ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයයේ) ආයතනික පරිවර්තනයකි. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතනවලට නව ආයතනයක් එක් කෙරිණි.

NIA යනු එතරම් පහසු නොවන නමුත් අද රටට ඉතා වැදගත් සහ අදාළ කර්තව්‍යයක් වන නව්‍යකරණය සමඟ හැකි තරම් අවබෝධයෙන් කටයුතු කිරීම සඳහා වන නියෝජිතායතනයකි. NIA සජීවීව පැමිණියේ රට වසංගතයකට මුහුණ දී තිබෙන හා ගිනි කන්දක් මත වාඩි වී සිටීම හා සමාන ආර්ථික තත්ත්වයක් හරහා ගමන් කරමින් සිටින අතිශය සංකීර්ණ අවස්ථාවක ය. ආර්ථිකය සහ රට වැසියන් විදේශයන්ට බොහෝ ණයගැති නමුත් හිමිකම් පාන්නේ ඊට ඉතා අඩු ප්‍රමාණයකට වීම බෙහෙවින් අවාසනාවන්ත ය. අනෙක් අතට, මේවාට සම්මත පිළිතුරු සහ ප්‍රතිචාර නොපවතින හෝ අදාළ නොවන බැවින් නව්‍යකරණය සඳහා සත්‍ය වශයෙන් සුදුසු වන්නේ මෙවන් කාලයන් වේ. NIA පැන නගින්නේ ගැටළු වලින් පිරුණු ජාතික මෙහෙයුම් පසුබිමක් සමගින් වන අතර පළමු දිනයේ සිට පරීක්ෂාවට ලක්වීම අනිවාර්යයකි. ගතවූ වසර තුළ සංවිධාන ව්‍යුහය සක්‍රීය කිරීම සහ ස්ථානගත කිරීම සඳහා යම් කාලයක් ගත වූ අතර මෙය තවමත් සිදුවෙමින් පවතී. කෙසේ වෙතත්, NIA හි ආදර්ශ පාඨය 'වැදගත් වන්නේ නව්‍යකරණය පමණකි!' බැවින් නව්‍යකරණය සමග ඉදිරියට යාමට මෙම ගැටළු කණ්ඩායමට බාධාවක් නොවූ බව සටහන් කිරීමට අපි සතුටු වෙමු. ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාව එම කරුණට සාක්ෂි සපයයි.

නැවතත් කියන්නේ නම්, NIA යනු ක්ෂණිකව බිහිවූ දෙයක් නොවේ. එය කාලයාගේ ඇවෑමෙන් බිහිවූවකි. 2013 වසරේ සිට ශ්‍රී ලංකාව සතුව විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI – The Coordinating Secretariat for Science Technology and Innovation) පැවතිණ. NIA මගින් නියෝජනය වන්නේ COSTI හි සමාප්තිය සහ එහි ආයතනීකරණයයි. අදාළත්වය ඉතා පැහැදිලි වූවත් මෙම පරිවර්තනය පහසු නොවූ අතර, දේශය වෙත ඉලක්කගත එම කාර්ය නියමයේ වැදගත්කම අවබෝධ කරගත් බොහෝ දෙනෙකුට මෙම ආයතනය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ගෞරවය හිමිවිය යුතුය. මේ අවස්ථාවේදී වඩා වැදගත් වන්නේ එහි කාර්ය නියමය තේරුම් ගැනීමයි. NIA විසින් ප්‍රතිඵල ජනනය කර දිය යුතු අතර මෙය අසාර්ථක වීම විකල්පයක් නොවන තවත් අවස්ථාවක් විය යුතුය - අපගේ කාර්යාල පිවිසුමේ ඇපලෝ 13 ප්‍රකාශය තබා ඇත්තේ කණ්ඩායමට මේ සම්බන්ධයෙන් ඇති අභියෝගය මතක් කිරීමටයි! සභය දුන් කිහිප දෙනෙකු බොහෝ දේ බලාපොරොත්තුවෙන් සිටිනවා විය හැකි අතර තේරුම් ගත යුතු කරුණ නම් මෙහි සාර්ථකත්වය යනු බොහෝ දෙනෙකුගේ බරපතල ප්‍රගතියක් බවයි.

NIA යනු නව්‍යකරණය සඳහා වගකිව යුතු ආයතනයක් වන අතර එවැනි කාර්ය නියමයක් සහිත

ආයතනයක් විශේෂයෙන් ස්ථාපිත කරන ලද පළමු අවස්ථාව මෙයයි. මෙම මාතෘකාව සාකච්ඡා කිරීමේදී, පර්යේෂණ, නව නිපැයුම් සහ නව්‍යකරණයන්හි නාමකරණය පිළිබඳ බරපතල වැරදි වැටහීමක් ඇති බව සලකන විට, සමහර විට පහත සඳහන් කරුණු තරමක් සංක්ෂිප්ත පැහැදිලි කිරීමක් සපයයි - පර්යේෂණ යනු දැනුම උත්පාදනය කිරීමට මුදල් භාවිත කිරීම වන විට, නව්‍යකරණය යනු එම දියුණු කළ දැනුම මුදල් උත්පාදනය සඳහා යෙදවීමය. නව නිපැයුමක් ද යම් අලුත් දෙයක් සංවර්ධනය කිරීමේදී යෙදවුම් භාවිත කරන පර්යේෂණයකට සමාන වේ - එනම් වියදම් කිරීමකි. බොහෝ දෙන ඉගෙනුම ලබා පිටව යනවා විනා දැනුම හෝ නව නිපැයුම් මුදල් බවට පත් කිරීමේ මෙම ක්‍රියාවලිය නොතිබූ තරම් වූ අතර රටේ රැඳෙන සෙසු පිරිස සරල ලෙස එදිනෙදා කටයුතු ඔහේ අනුගමනය කරනු පමණක් බැවින් ජාතික ආර්ථිකයට කරන ආයෝජනවලින් සැබෑ ධනාත්මක ප්‍රතිලාභ නැතත් නියත වශයෙන්ම සමහර බාහිර ආර්ථිකයන් සඳහා නම් සැළකියයුතු තරමේ අඩු වියදම් යටතේ ප්‍රතිලාභ තිබේ. නව නිපැයුම්කරුවන්, අප කවුරුත් දන්නා සහ අසන්නට ලැබෙන පරිදි, පසු වන්නේ පරිවර්තනයේ ගැටලු සම්බන්ධයෙන් බරපතල මැසිවිලි සමගිනි. මෙසේ හෙයින්, අභාවප්‍රාප්ත මුනිදාස කුමාරතුංග මහතාගේ ප්‍රකාශය දශක ගණනාවක් තිස්සේ අපට තිබෙන ප්‍රශ්නය දැක්වීමෙහිලා වඩාත් යෝග්‍ය වේ - අලුත් අලුත් දේ නිෂ්පාදනය නොකරන රටක් ලොව නොනඟින අතර මෙම 'අලුත් දේ' සම්පූර්ණ වන්නේ නව්‍යකරණයේ පියවර තැබූ විට පමණි. ඕනෑම සංවර්ධිත ආර්ථිකයක් දෙස බැලූ විට, එය වර්ධනයට හේතු වී ඇත්තේ සමාජය පුරා ගෙන ගිය නිර්මාණාත්මක වෙනස්කම් බව පෙනේ. භාවඩ් හි ආර්ථික සංකීර්ණතා සිතියම ක්‍රියා කරවා බැලූ විට, ශ්‍රී ලංකාවේ අපනයන කූඩයේ වසර 75ක් පසුකරමින් සිටින අපට කිරීමට නොහැකි වූ දේ ඔබට ඉක්මනින්ම වැටහේ. එහි වියට්නාමය වැනි රටවල් දෙස බැලූ විට අපගේ තීරණ ගැනීමේ ලා දුර්වලතාවය ඔබට අවබෝධ වනු ඇත.








Creative enterprises and individuals
Research into Rupees

ආයතනය පිහිටුවා තිබීම යන්නෙන් තීරණ ගැනීම හරහා නව්‍යකරණයේ වටිනාකම පිළිගෙන ඇති බවත් අපගේ මාවත පැහැදිලි, නිරවද්‍ය සහ වේගවත් ගමනක් යාමට සූදානම් බවත් අදහස් නොවේ. තරුණ ආයතනය විසින් විසඳා ගත යුතුව ඇති වැදගත් ආකල්පමය ගැටළු තවමත් පවතී. නව්‍යකරණය පමණක් වැදගත් වේ යන උධෘත පාඨය සමඟ, මෙම පණිවිඩය සමාජය වෙත යොමු කිරීම සඳහා NIA සැබවින්ම එහි කාර්යයන් සකස් කොට ගෙන ඇත. උපදේශනයට සෑම විටම සිය අවධානය යොමු කළ නොහැකිය. නව්‍යකරණ පරිසර පද්ධතිය හරහා නව්‍යකරණය සිදු කළ හැකිය. සියලුම පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම සහ පරිසර පද්ධතියට ශක්තියක් ලබා දීම වහාම සිදු කිරීමට අවශ්‍ය ය. නව්‍යකරණය සඳහා වන ආකෘතිය - ත්‍රිත්ව හෙලික්ස ආකෘතිය (විශ්ව විද්‍යාල, කර්මාන්ත සහ රජය) NIA ලාංඡනයේ කොටසකි. නව්‍යකරණ පරිසර පද්ධතියේ ඵලදායිතාව නිරන්තරයෙන් ආමන්ත්‍රණය කළ යුතු අතර පද්ධතිය නව මෙවලම් සහ යාන්ත්‍රණ සමඟ උත්ප්‍රේරණය කළ යුතුය. ශ්‍රී ලංකාවට ආයතනවල හිඟයක් නැත. බොහෝ දුරට දක්නට නැත්තේ පොදු අරමුණක් ඇතිව එකට වැඩ කිරීමයි. නව්‍යකරණය අරමුණෙහි ප්‍රතිඵලයකි.

NATIONAL INNOVATION AGENCY
SRI LANKA
*"Where innovation only matters"*

**Triple Helix Model of Innovation**




පනතේ (2019 අංක 22 දරන පනත) විස්තර කර ඇති පරිදි NIA හි අරමුණු, මෙන්ම කාර්යයන් සහ රාජකාරි මෙම වාර්තාවේ ලැයිස්තුගත කර ඇත. ඔබ දකින පරිදි NIA හට ඉටු කිරීමට බොහෝ දේ ඇති නමුත් ඒවා ඉතා අවශ්‍ය කාර්යයන් බවට ඔබ එකඟ වනු ඇත.

NIA කුලුනු පහක් හරහා නව්‍යකරණ කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර ඒ සෑම එකක් සඳහාම අදාළ ක්ෂේත්‍රයේ නියෝජිතායතනයක් හෝ ආයතනයක් සමඟ හවුල් වීමට අපේක්ෂා කරයි. ප්‍රගතියක් ලබා ගැනීමට හවුල්කාරිත්වය ප්‍රධාන වශයෙන් වැදගත් වන්නේ නව්‍යකරණය කණ්ඩායම් ක්‍රීඩාවක් වන අතර නව නිපැයුම් සහ පර්යේෂණ හුදකලාව වුවද කළ හැකි බැවිණි. NIA හි කුලුනු පහ වන්නේ විද්‍යා හා තාක්ෂණ නව්‍යකරණය, සේවා නව්‍යකරණය, සමාජ නව්‍යකරණය, පරිසර නව්‍යකරණය සහ ආරක්ෂක නව්‍යකරණය යි. විද්‍යා හා තාක්ෂණ නව්‍යකරණය වැදගත් පළමු පියවරක් ලෙස සම්පත් සමග මුසු වීම උදෙසා වැඩි දියුණු කරගත් හා අත්පත් කරගත් දැනුම අපේක්ෂා කරයි. එය අනෙකක් නොව පාරිභෝගික භාණ්ඩ වලින් වටිනාකම් එකතු කරන ලද තරඟකාරී නිෂ්පාදන වෙත – සම්පත් සහ දැනුම මුසු කිරීම මගින් - ගමන් කිරීමයි සේවා නව්‍යකරණය වැඩි කල් නොයා ඩිජිටල්කරණය වැලඳ ගන්නා අතර නිර්මාණාත්මක වෙනසක් සිදු කිරීමේ වැදගත්කම තේරුම් ගනී. පැරණි පිළිවෙත් සහ ක්‍රියාවලීන් අපගේ සමාජයට බාධාවක් වී ඇති අතර සමාජ නව්‍යකරණයන් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වේ. සෑම නව්‍යකරණයක් ම ආයෝජන මත ලාභ ලබා ගැනීමේ අරමුණින් සිදු නොකළ යුතුය. වර්තමාන ගෝලීය සෞඛ්‍යය නව්‍යකරණය කිරීමේදී ඉහළ මට්ටමේ අවබෝධයක් අවශ්‍ය බව පරිසර නව්‍යකරණයන් තේරුම් ගනී; රේඛීය ආර්ථිකයන් වෘත්තාකාර ආර්ථිකයන් බවට පරිවර්තනය කිරීම, සොබාදහම මත පදනම් වූ ව්‍යවසායකත්වය, නීල-හරිත ආර්ථික මාර්ග සහ ශ්‍රී ලංකාව වැනි ජෛව විවිධත්වයෙන් පොහොසත් ස්ථානයකින් ලද හැකි ජෛව අනුකරණ ඉගෙනුම ඒ අතර වේ. තවමත් හෙළි කර නොගත් ශක්‍යතාවයන් බොහොමයක් මේ කොටසේ ඇතුළත් ය. අවසාන වශයෙන්, ආරක්ෂාව යනු සෑමවිටම "මිනිසුන් සහ අණ දීම්" සමඟ "තුවක්කු සහ උණ්ඩ" නොවේ. සිංගප්පූරුව 'සම්පූර්ණ ආරක්ෂාව' ඉදිරිපත් කරන අතර එම සංකල්පයම නව්‍යකරණයකි. නව්‍යකරණ කුලුනු සහ සමමුහුර්තකරණය සමඟ, මහඟු අවස්ථාවන් දැකිය හැකිය. මේ ආකාරයෙන් උපයන ධනය සැබවින්ම ජාතික ධනය වනු ඇත. අපගේ පළමු වසර තුළ අපි නව්‍යකරණ පරිසර පද්ධතිය ගොඩනැගීමට කාලය වැය කළ අතර වැදගත් ක්‍රියාධරයන් සමඟ සම්බන්ධ වීමු.

ආර්ථික වර්ධනය, සංවර්ධනය සහ වඩා හොඳ රැකියා සඳහා නව්‍යකරණයන් කේන්ද්‍රීය ධාවකය බව අවට බැලීමෙන් පැහැදිලි වේ. ඉන්දියාවේ සහ ඊශ්‍රායලයේ සිට කෙන්යාව දක්වා බොහෝ රටවල් හරහා අප නිරීක්ෂණය කරන ආයතනික උදාහරණයක් වන්නේ මේ සඳහා පහසුකම් සපයන නව්‍යකරණ ආයතන තිබීමයි. ඉන්දියාව සහ චීනය වැනි රටවල් GII (ගෝලීය නව්‍යකරණ දර්ශකය) ඇගයීම අභ්‍යන්තර සැලසුම්කරණය සඳහා ප්‍රයෝජනවත් රාමුවක් ලෙස බැරෑරුම් ලෙස සලකයි. ජාත්‍යන්තර සංවර්ධන

ආයතන විසින් ද රටවල්වල නව්‍යකරණ ආයතන පිහිටුවා ඇත – උදා: සර්බියාව. රජය සතු තවත් ව්‍යවසායකයක් පිළිබඳ තර්කනය පැහැදිලි නමුත් තර්කයෙන් පමණක් පරිවර්තනයක් සිදු නොවේ. මුනිදාස කුමාරතුංගයන්ගේ කවියේ ගැබ්ව ඇති දර්ශනය බොහෝ කලක සිට අපගේ ප්‍රතිපත්ති සහ භාවිතයේ අතුරුදහන් වී ඇතත්, රුවන්ඩාව වෙනුවෙන් පෝල් කගමේ ප්‍රකාශ කර ඇති සත්‍යය අප පිළිගත යුතුය - "අපට ඔරලෝසුව ආපසු හැරවිය නොහැකිය, නමුත් අපට අනාගතය තීරණය කිරීමේ බලය ඇත".

**අජිත් ද අල්විස්**
රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, මොරටුව විශ්වවිද්‍යාලයය
ප්‍රධාන නව්‍යකරණ නිලධාරී (වැඩ බලන) - NIA

පරිපාලන රාමුව

## NIA පාලක සභාව (01-01-2022 සිට 31-12-2022)

සභාපති – ජනාධිපති ලේකම්

ගාමිණී සේදර සේනරත් මහතා (2022 ජනවාරි – ජූලි)

ඊ එම් එස් බී ඒකනායක මහතා (2022 ජූලි – අද දක්වා)


සාමාජිකයන්:

ආචාර්ය සංකල්ප ගම්වරිගේ මහතා
මංජු ගුණවර්ධන මහතා
ආචාර්ය හාන්ස් විජයසූරිය මහතා
ආචාර්ය හර්ෂ සුබසිංහ මහතා
ඉංජිනේරු උදය දම්පගේ මහතා
මහාචාර්ය රොහාන් මුණසිංහ මහතා
පී .එල්. පත්මකුමාර මහතා
ටී .බී .එම්. අතපත්තු මහතා
ඊ. ඒ. රත්නසීල මහතා
කේ .ආර්. පත්මප්‍රිය මහතා (2022 ජනවාරි – ඔක්තෝබර්)
ආචාර්ය නරේෂ් හඳගම මහතා
සංජීවනී වීරසේකර මහත්මිය (2022 ජනවාරි – ඔක්තෝබර්)
බී .එම් .එස්. බණ්ඩාර මහත්මිය
ගීතාංජලී ආර්. රණවක මහත්මිය
ජී.එල්. ඥානතේව මහතා
මහාචාර්ය එන් .එම් .එස්. සිරිමුතු මහතා
නදීකා වටලියද්ද මහත්මිය (2022 ඔක්තෝබර් – දෙසැම්බර්)
එච් .සී.ඩී .එල්. සිල්වා මහතා (2022 ඔක්තෝබර් - අද දක්වා)

2022 දී පවත්වන ලද පාලක සභා රැස්වීම් ගණන: **06**

| | රැස්වීම් අංකය | දිනය |
|---|---|---|
| 01 | 01-2022 | 2022 මාර්තු 18 |
| 02 | 02-2022 | 2022 අප්‍රේල් 29 |
| 03. | 03-2022 | 2022 මැයි 27 |
| 04 | 04-2022 | 2022 ඔක්තෝබර් 21 |
| 05 | 05-2022 | 2022 නොවැම්බර් 25 |
| 06 | 06-2022 | 2022 දෙසැම්බර් 21 |

**ආයතනික ව්‍යුහය** (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද)



**2022 දෙසැම්බර් 31 වන විට කාර්ය මණ්ඩලය**

මහාචාර්ය අජිත් ද අල්විස් – ප්‍රධාන නව්‍යකරණ නිලධාරී (වැඩ බලන)

වෛද්‍ය සචී පනාවල - අතිරේක ප්‍රධාන නව්‍යකරණ නිලධාරී

වින්ධ්‍යා විජේසිංහ මහත්මිය – ජ්‍යෙෂ්ඨ නව්‍යකරණ නිලධාරී (තාක්ෂණ හුවමාරු හා වාණිජකරණය)

නවෝදි වික්‍රමසිංහ මෙනෙවිය – ජ්‍යෙෂ්ඨ නව්‍යකරණ නිලධාරී (සේවා හා සමාජ නව්‍යකරණ)

තිදසි දහනායක මහත්මිය – ජ්‍යෙෂ්ඨ නව්‍යකරණ නිලධාරී (විද්‍යා, තාක්ෂණ හා පරිසර නව්‍යකරණ)

පූජා මලවිසූරිය මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්)

වජිරා පෙරේරා මෙනෙවිය - තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අපේක්ෂිතය

ශනික අබේරත්න මහතා - තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අපේක්ෂිතය

චාමිකර ද සිල්වා මහතා - තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අපේක්ෂිතය

ලසිත කුමාර මහතා (කාර්යාල සහකාර)

ගනේෂා විජේසිංහ මිය - ගණකාධිකාරී (වැඩබලන.), අධ්‍යාපන අමාත්‍යාංශය

**2022 දී NIA හි කාර්ය සාධනය**

## කාර්යක්ෂම සම්බන්ධතාවය සඳහා ඩිජිටල් වේදිකා සංවර්ධනය කිරීම

**ජාතික තාක්ෂණ හා නවාකරණ වේදිකාව සංවර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ සාකච්ඡා**

නවාකරණ හා තාක්ෂණ පරිසර පද්ධතිය සඳහා ඩිජිටල් වේදිකාවක් සංවර්ධනය කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) අතර මූලික සාකච්ඡාවක් පැවැත්විණි.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ශ්‍රී ලංකාවේ ඩිජිටල් ශ්‍රී ලංකා ඉලක්කය සාක්ෂාත් කර ගැනීම, සම්බන්ධතාවය නිර්මාණය කිරීම, නවාකරණයට සහාය වීම සහ සහයෝගිතා මුලපිරීම් සඳහා ජාතික මට්ටමේ තාක්ෂණය පදනම් කරගත් වේදිකාවක් ක්‍රියාත්මක කිරීම යන මෙහෙවර සමඟ ශ්‍රී ලංකාවේ ඵලදායී ඩිජිටල් පරිවර්තනයක් සඳහා මාවත සකස් කිරීම සඳහා 'ජාතික තාක්ෂණය සහ නවාකරණ වේදිකාවක්' සංවර්ධනය කිරීමට උත්සාහ කරයි.

විද්‍යාව, තාක්ෂණ අවකාශය සම්බන්ධ කිරීම සහ නව නිපැයුම්කරුවන් සහ ආයෝජකයින් සම්බන්ධ කිරීම සඳහා දැනටමත් NIA විසින් ජාතික නවාකරණ ප්‍රගති පුවරුව හා Business2People (B2P) වේදිකා සංවර්ධනය කර ඇත. වර්තමානයේ මෙම වේදිකා දෙක වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. මෙම හමුව ශ්‍රී ලංකාවේ නවාකරණ හා තාක්ෂණ පරිසර පද්ධතිය ඩිජිටල් ලෙස සම්බන්ධ කිරීම සඳහා ආයතන දෙකටම එකට වැඩ කිරීමට මාර්ගය ලබා දෙනු ඇත.



### Labnet.lk

රට පුරා පිහිටි පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල 20කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කරමින් ශ්‍රී ලාංකේය පර්යේෂකයන්ට පර්යේෂණ හා සංවර්ධන උපකරණ සොයා ගැනීමට ලෝක ව්‍යාප්ත වෙබ් පාදක දොරටුව වීමේ අපේක්ෂාවෙන් SLINTEC, COSTI සහ e-Class හි සහයෝගීතා කාර්යයක් ලෙස Labnet.LK සංවර්ධනය කරන ලදි. SLINTEC සිය මෙහෙයුම් නිල වශයෙන් 2022 මාර්තු 16 වන දින NIA වෙත භාර දුන්නේය. මෙම මුලපිරීම සැලකිල්ලට ගනිමින් NIA, SLINTEC සහ e-Class අතර අවබෝධතා ගිවිසුමක්

SLINTEC හිදී අත්සන් කරන ලදි.

අනාගතයේදී Labnet.lk හි මෙහෙයුම් කාර්ය ප්‍රවාහය සකස් කිරීම සඳහා SLINTEC, NIA සහ e-Class Solutions අතර ත්‍රිපුද්ගල අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදි. ඒ අනුව, NIA විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ Labnet.lk මෙහෙයවීම සහ පවත්වාගෙන යාමට නියමිත විය.




## නිර්දේශ සඳහා ප්‍රතිපත්ති ලේඛන සංවර්ධනය කිරීම

**උපකරණ බෙදාගැනීමේ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම**

උපකරණ මිලදී ගැනීම සඳහා රජයේ අරමුදල් ලබන රාජ්‍ය අංශයේ ශාස්ත්‍රීය හා පර්යේෂණ ආයතනවල උපකරණ බෙදාගැනීම පිළිබඳ ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කරන ලදි. මෙය ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) සමඟ එක්ව සිදු කරන ලද අතර කෙටුම්පත ඉදිරි කටයුතු සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) වෙත යොමු කරන ලදි.


## ගෝලීය දර්ශකවල ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉහළ නැංවීම

**නව්‍යකරණයට ශ්‍රී ලංකාවේ ආර්ථික පුනරුදයේ ප්‍රමුඛත්වය දීම**

**ගෝලීය නව්‍යකරණ දර්ශකය (GII) ජාතික ජනගත කිරීම - ශ්‍රී ලංකාව**

ගෝලීය නව්‍යකරණ දර්ශකය (GII) නවතම ගෝලීය නව්‍යකරණ ප්‍රවණතා නිරීක්ෂණය කරන අතර ලෝකයේ වඩාත්ම නව්‍ය ආර්ථිකයන් හෙළි කර, නව්‍යකරණ ශක්තීන් සහ දුර්වලතා ඉස්මතු කරමින් ආර්ථිකයන් 132 ක පමණ නව්‍යකරණ කාර්ය සාධනය ශ්‍රේණිගත කරයි. නව්‍යකරණය පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් හැකිතාක් ග්‍රහණය කර ගැනීමට අපේක්ෂා කරන මෙම දර්ශකය එක් එක් ආර්ථිකයේ දේශපාලන පරිසරය, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ දැනුම නිර්මාණය පිළිබඳ පියවර ඇතුළු දර්ශක 80කින් පමණ සමන්විත වේ. GII විසින් ඉදිරිපත් කෙරෙන විවිධ ප්‍රමිතික එකම කලාපයක් හෝ ආදායම් කණ්ඩායමක් තුළ ආර්ථිකයට එරෙහිව කාර්ය සාධනය සහ මිණුම් සලකුණු වර්ධනයන් නිරීක්ෂණය කිරීමට උපකාරී වේ.
ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO) විසින් 2022 සැප්තැම්බර් 29 වන දින 15 වන ගෝලීය නවෝත්පාදන දර්ශකය (GII) දියත් කරන ලද අතර, ඒ අනුව, ශ්‍රී ලංකාව ලෝක ආර්ථිකයන් 132 ක් අතර GII

2022 හි 85 වන ස්ථානයට පත්ව ඇත. මෙය GII 2021 හි 95 වන ස්ථානයේ සිට ස්ථාන 10 ක පිම්මක් වන බැවින්, ගෝලීය දර්ශකවල ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන ඒම සඳහා බලය පවරන ලද රජයේ ආයතනය වන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA), 2022 ඔක්තෝබර් 7 වන දින තථ්‍ය හා අතථ්‍ය හමුවක් ලෙස කොළඹ 10, TRACE එක්ස්පර්ට් සිටි හි දී සුහුරු අනාගතයක් සඳහා වන මධ්‍යස්ථානය (Centre for a Smart Future) සහ WIPO සමඟ ජාතික මට්ටමින් ජාතික ජනගත කිරීමක් සංවිධානය කළේය.



Global Innovation Index 2022

SRI LANKA

85th Sri Lanka ranks 85th among the 132 economies featured in the GII 2022.

**The Global Innovation Index (GII) ranks world economies according to their innovation capabilities. Consisting of roughly 80 indicators, grouped into innovation inputs and outputs, the GII aims to capture the multi-dimensional facets of innovation.**

The following table shows the rankings of Sri Lanka over the past three years, noting that data availability and changes to the GII model framework influence year-on-year comparisons of the GII rankings. The statistical confidence interval for the ranking of Sri Lanka in the GII 2022 is between ranks 80 and 87.

Rankings for Sri Lanka (2020–2022)

| GIIYR | GII | Innovation inputs | Innovation outputs |
|---|---|---|---|
| 2020 | 101 | 107 | 83 |
| 2021 | 95 | 103 | 85 |
| 2022 | 85 | 102 | 68 |

- Sri Lanka performs better in innovation outputs than innovation inputs in 2022.
- This year Sri Lanka ranks 102nd in innovation inputs, higher than both 2021 and 2020.
- As for innovation outputs, Sri Lanka ranks 68th. This position is higher than both 2021 and 2020.



*(දක්ෂිණාවෘතව: ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, ආචාර්ය සචා වන්ෂ්- වින්සන්ට් මහතා, රනිල් විතාරණ මහතා සහ මහාචාර්ය සෞමිත්‍ර දත්තා මහතා)*

ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ ගෝලීය නව්‍යකරණ දර්ශකයේ (GII) අංශ ප්‍රධානී සහ ආර්ථික හා සංඛ්‍යාලේඛන අංශයේ ප්‍රධානී ආචාර්ය සචා වින්සන්ට් මහතා ද සහභාගී විය. ඔක්ස්ෆර්ඩ් සෙඩ් ව්‍යාපාරික පාසලේ පීඨාධිපති සහ GII හි නිර්මාතෘ සහ කර්තෘ මහාචාර්ය සෞමිත්‍ර දත්තා විසින් මුඛ්‍ය-දේශනය සිදු කරන ලදී.

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ප්‍රධාන නව්‍යකරණ නිලධාරී මහාචාර්ය අජිත් ද අල්විස්, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ නව්‍යකරණ නිලධාරී වින්ධ්‍යා විජේසිංහ මහත්මිය, ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ සැලසුම් හා මෙහෙයුම් අධ්‍යක්ෂ සහ ට්‍රේස් සිටි අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික, ඉංජිනේරු හේමින්ද ජයවීර මහතා, MAS හෝල්ඩින්ග්ස් හි ප්‍රධාන නව්‍යකරණ නිලධාරී රනිල් විතාරණ මහතා සහ සුහුරු අනාගතයක් සඳහා වූ මධ්‍යස්ථානයේ ආර්ථික විද්‍යාඥ සහ සම-නිර්මාතෘ අනුෂ්ක විජේසිංහ මහතා ද අදහස් පළ කළහ. අනුෂ්ක විජේසිංහ මහතා සභාව මෙහෙයැවීය.


**එක ගමක් එක සන්නාමයක්**

ජාතික නව්‍යකරණ මෙහෙයුම යටතේ ප්‍රජා නව්‍යකරණ ව්‍යාපෘතියට සහාය දක්වමින් NIA විසින් එක් ගම්මානයක් එක් සන්නාමයක් වැඩසටහන ආරම්භ කරන ලදි. වැඩසටහන් සංකල්පයට ප්‍රධාන වශයෙන් ගම්මාන / දිස්ත්‍රික්/ පළාත් මට්ටමින් අද්විතීය තාක්ෂණයන් හඳුනා ගැනීම, උපදේශන වැඩසටහන් හරහා වාණිජකරණ හැකියාවන් විශ්ලේෂණය කිරීම, අවශ්‍ය තාක්ෂණික විශේෂඥයන් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම සහ වාණිජකරණ හිඩැස් සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන ආයතන සම්බන්ධ කිරීම ඇතුළත් වේ. මෙම වැඩසටහන මගින් බුද්ධිමය දේපල කළමනාකරණය සහ තාක්ෂණික හුවමාරුව මෙන්ම අදාළ ව්‍යාපාරික උපාය මාර්ග සඳහා පහසුකම් සැලසීම මගින් තාක්ෂණික සහාය සැපයීම, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල ගවේෂණය කිරීම සහ විනිවිද යාම පිළිබඳ විශේෂඥ සේවාවක්

ලබා දෙනු ඇත. TISC@ NIA මෙම වැඩසටහන සඳහා IP සහ තාක්ෂණික හුවමාරු සහාය අංශය ලෙස කටයුතු කරනු ඇත. මෙම වැඩසටහන තුළින් ජීවනෝපාය ඉහළ නැංවීම සහ පළාත් මට්ටමින් අත්‍යවශ්‍ය දේ ආමන්ත්‍රණය කිරීම අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන කළමනාකරණය කිරීම සඳහා කොරියානු යෝග්‍ය තාක්ෂණ සංවර්ධනය සහ IP හුවමාරු ව්‍යාපෘතිය සහ දැව නව්‍යකරණ ව්‍යාපෘතියෙන් ලබාගත් දැනුම සහ අත්දැකීම් NIA විසින් භාවිත කරනු ඇත.






ශ්‍රී ලාංකික ගෘහ කර්මාන්ත සමඟ කටයුතු කරමින් සිටින වේවැල්, පිත්තල, කුඹල්, ගෘහ භාණ්ඩ සහ ග්‍රාමීය කාර්මික ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (6.4.8 අයවැය කථාව, 2022) සමඟ NIA විසින් සාකච්ඡා ආරම්භ කරන ලදි.

**2022 කාන්තා දින සැමරුම්**




2022 මාර්තු 8 වන දින පවත්වන ලද WIPO ජාත්‍යන්තර කාන්තා දිනය සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය ශ්‍රී ලංකාවේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේ "ආසියා-පැසිෆික් කලාපයේ කාන්තාවන්: වඩා හොඳ ලෝකයක් සඳහා නව්‍යකරණය" යන තේමාව යටතේ ය. එය WIPO විසින් සංවිධානය කරන ලද අතථ්‍ය සම්මන්ත්‍රණයක් වූ අතර විද්වත් කථිකයෝ තිදෙනෙක් මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකාව නියෝජනය කළහ. NIA හි ජ්‍යෙෂ්ඨ නව්‍යකරණ නිලධාරී වින්ධ්‍යා විජේසිංහ මහත්මිය "STEM ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ පරතරය අවසන් කිරීම" යන සැසිවාරය සඳහා විද්වත් මණ්ඩල සාමාජිකාවක්

වූවාය. විජේසිංහ මහත්මිය ශ්‍රී ලංකාවේ වර්තමාන නවාකරණ තත්ත්වය සහ නවාකරණයේ ස්ත්‍රී පුරුෂ පරතරය අවසන් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තත්ත්වය ඉහළ නැංවීම සඳහා NIA කටයුතු කරන ආකාරය ඉස්මතු කළාය. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් දීපා ලියනගේ මහත්මිය "කලාපයේ හොඳම භාවිතයන්" සැසිය යටතේ "බුද්ධිමත් කාන්තාවන්" වැඩසටහන පිළිබඳව කතා කළ අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයයේ වෛද්‍ය විද්‍යා පීඨයේ මහාචාර්ය නීලිකා මලවිගේ "ශ්‍රී ලංකාවේ IP පද්ධතියේ හිඩැස්" පිළිබඳව අදහස් දැක්වූවාය.

## ජාතික තාක්ෂණ හුවමාරු පද්ධතියක් සංවර්ධනය කිරීම

### WIPO සක්‍රිය නවාකරණ පරිසර ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාව

සක්‍රිය නවාකරණ පරිසර (EIE) ව්‍යාපෘතිය යනු IP පදනම් කරගත් පර්යේෂණ/තාක්ෂණ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ (WIPO) ගෝලීය ආරම්භයකි. තාක්ෂණික හුවමාරු වෘත්තිකයන් සංවර්ධනය කිරීම සහ රටේ ප්‍රධාන පර්යේෂණ හා සංවර්ධන ආයතන/ විශ්ව විද්‍යාලවල නිසි තාක්ෂණ හුවමාරුව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේදී ආරම්භ කරන ලදි. Hub & Spoke මාදිලියේ ජාලයක් භාවිතයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. ජාතික බුද්ධිමය දේපල කාර්යාලයය (NIPO) ව්‍යාපෘති ලේකම් කාර්යාලයය ලෙස කටයුතු කරන අතර NIA (පෙර දී COSTI) කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරයි. තෝරාගත් පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල ආරම්භයේ සිටම ස්පෝක් හෙවත් විහිදුම් ලෙස මෙම ව්‍යාපෘතියට සහභාගී විය. WIPO පිළිගැනීම සහිතව, වර්තමානයේ NIA තවත් විශ්ව විද්‍යාල සහ පර්යේෂණ හා සංවර්ධන ආයතනවල TT (තාක්ෂණ හුවමාරුව) සැකසුම වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ඔවුන් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ කරයි.

### EIE දුරස්ථ උපදේශන වැඩසටහන (2021-2022)

WIPO EIE ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ වාණිජකරණ උපදේශන වැඩසටහන මඟින් වාණිජමය විභව තාක්ෂණයන් සඳහා විශේෂ වාණිජකරණ ඇගයීම් සහ සහාය ලබා දේ. මෙම වැඩසටහන මාස 6 ක කාලරාමුවකින් යුත් වාර්ෂික පදනමක් මත අතථ්‍ය වේදිකාවක් හරහා WIPO විසින් පත් කරන ලද තාක් ෂණ හුවමාරු විශේෂඥයන් විසින් පවත්වනු ලැබේ. ආයතනයේ/විශ්ව විද්‍යාලයයේ තාක්ෂණ හුවමාරු කාර්යාලය (TTO) හරහා ඉදිරිපත් කරනු ලබන තාක්ෂණයන් නිසි වාණිජකරණ උපාය මාර්ගයක් සකස් කිරීම සඳහා කෙටි ලැයිස්තුගත කර මග පෙන්වනු ලැබේ. මෙම ක්‍රියාවලියට තාක්ෂණික හා වෙළඳපල තක්සේරු කිරීම්, නව නිපැයුම්වල වාණිජකරණ විභවය, තාක්ෂණික සලකුණු කිරීම, බලපත්‍ර උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම යනාදිය ඇතුළත් වේ. EIE නොවන ආයතන සඳහා, NIA හි තාක්ෂණ නවාකරණ සහාය මධ්‍යස්ථානය (TISC) හරහා ඔවුන්ගේ විභව තාක්ෂණයන් ඉදිරිපත් කිරීමට උපදේශන සහාය දීර්ඝ කරන ලදි. NIA හි TISC වැඩසටහනේ බලයලත් තාක්ෂණ හුවමාරු කාර්යාලයය ලෙස ක්‍රියා කරන අතර එහි වාණිජකරණ ක්‍රියාවලියේදී තෝරාගත් තාක්ෂණයන්ට සහාය වීම සඳහා පත් කරන ලද උපදේශකයා සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. තවද, තාක්ෂණික හුවමාරු කාර්යාලය ස්ථාපිත කිරීම, අදාළ ප්‍රතිපත්ති සහ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය මානව සම්පත් කුසලතා සංවර්ධනය කිරීම මගින් ආයතනය තුළ නිසි තාක්ෂණ වාණිජකරණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සඳහා

TISC@ NIA ඒකකය මග පෙන්වයි.

විශ්ව විද්‍යාල හා පර්යේෂණ හා සංවර්ධන ආයතන 14 ක තාක්ෂණයන් විස්සක් (20) ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ සම්බන්ධීකරණයෙන් උපදේශනය කරන ලදි. ලෝක බුද්ධිමය දේපල සංවිධානය විසින් පහසුකම් සපයනු ලබන ජාත්‍යන්තර තාක්ෂණ හුවමාරු විශේෂඥයින්ගේ උපදේශකත්වය සහිතව මෙම ආයතනවල තාක්ෂණික හුවමාරු කාර්යාල ඔවුන්ගේ තාක්ෂණික වාණිජකරණ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමෙන් ප්‍රතිලාභ ලබා ඇත.

**EIE ආයතනික IP ප්‍රතිපත්ති සංවර්ධනය**

ආයතනික විශේෂිත IP ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා ආයතනවලට සහාය වීම සඳහා ආයතනික බුද්ධිමය දේපල සංවර්ධන වැඩසටහන ආරම්භ කරන ලදි. WIPO විසින් පත් කරන ලද විශේෂඥයෝ ප්‍රතිපත්ති වර්ධනයන් හෝ සංශෝධන සඳහා සහාය වීම සඳහා තෝරාගත් ආයතන සමඟ කටයුතු කරති. යාපනය විශ්ව විද්‍යාලයය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයය (KDU), රබර් පර්යේෂණ ආයතනය සහ පශ්චාත් අස්වනු කළමනාකරණ ජාතික ආයතනය මෙම වැඩසටහන සඳහා සහභාගී වේ. NIA හි TISC IP ප්‍රතිපත්ති සංවර්ධන ක්‍රියාවලියේ ආයතන සම්බන්ධීකරණය හා සහාය දැක්වීම සිදු කරයි.

**තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම් පිළිබඳ EIE වාර්ෂික සමීක්ෂණය**


ශ්‍රී ලංකාවේ පර්යේෂණ වාණිජකරණ පද්ධතියේ නිසි අධීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ හුවමාරුව පිළිබඳ වාර්ෂික සමීක්ෂණය පවත්වන ලදි. විශ්ව විද්‍යාල තාක්ෂණ කළමනාකරුවන්ගේ සංගමයේ (AUTM) වාර්ෂික බලපත්‍ර ක්‍රියාකාරකම් සමීක්ෂණය වැනි ජාත්‍යන්තරව පිළිගත් සමීක්ෂණ මත මෙම සමීක්ෂණය පදනම් විය. මෙම සමීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කර ඇත. UGC සහ ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ (WIPO) සහාය ඇතිව විශ්ව විද්‍යාලවල ලංකා තාක්ෂණ හුවමාරු කාර්යාල සංගමයේ (LATTO) සහයෝගයෙන් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය මෙම සමීක්ෂණය සම්බන්ධීකරණය කළේය.

වාර්ෂිකව මෙම සමීක්ෂණය සිදු කිරීම සඳහා වෙබ් අඩවි පදනම් කරගත් වේදිකාවක් සංවර්ධනය කෙරෙමින් පවතී. පර්යේෂණ පිරිවැය, බුද්ධිමය දේපල, තාක්ෂණ බලපත්‍ර, ආරම්භක සංස්ථාගත කිරීම, නිෂ්පාදන වාණිජකරණය යනාදිය ඇතුළුව පර්යේෂණ වාණිජකරණ ක්‍රියාකාරකම්වල සංඛ්‍යාන දත්ත රැස් කරනු ලැබේ. එකතු කරන ලද දත්ත තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම්වල වටිනාකම සන්නිවේදනය කිරීමට සහ ජාතික ආර්ථිකයට තාක්ෂණ හුවමාරු බලපෑම ප්‍රමාණනය කිරීමට භාවිත කරනු ඇත.

**වාණිජකරණය සහ උපදේශනය**

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් සම්බන්ධයෙන් රසකැවිලි නිෂ්පාදකයින් සහ අයිස්ක්‍රීම් නිෂ්පාදකයින් සමඟ සාකච්ඡා පැවැත්විණි. මෙම තාක්ෂණයන් WIPO EIE වැඩසටහන යටතේ WIPO වාණිජකරණ විශේෂඥයින් විසින් උපදේශනය කරන ලදි. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (NIPHM) සඳහා බලයලත් තාක්ෂණ හුවමාරු කාර්යාලය (TTO) ලෙස කටයුතු කළ NIA, එම ආයතනයට තමන්ගේම TTO සංවර්ධනය කිරීමට සහාය විය.






## PERA TECH-DISRUPT 2K22

පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ ව්‍යාපාරික සම්බන්ධතා, නව්‍යකරණ, ඉන්කියුබේෂන් සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය (BLII- TTO) විසින් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ එක්ව ජාතික මට්ටමේ නව්‍යකරණ ඉදිරිපත් කිරීමේ අභියෝගයක් සංවිධානය කරන ලදි. විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන, පර්යේෂණ ආයතන සහ ව්‍යාපාරික ප්‍රජාවන්ගෙන් නව නිපැයුම්කරුවන්/නව්‍යකාරකයන් අතර තාක්ෂණ හුවමාරුව සහ ව්‍යවසායකත්ව සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය. නව්‍යකරණයන් සම්බන්ධ කිරීමට, ඉගෙනීමට සහ ප්‍රවර්ධනය කිරීමට අන්තර්ක්‍රියාකාරී අවස්ථා, තාක්ෂණික හුවමාරුව සහ වැඩමුළු මාලාවක්, අවසාන ඉදිරිපත් කිරීම් උත්සවයක් සහ සම්මාන ප්‍රදානෝත්සවයක් සමඟින් මෙම මුලපිරීම දෙමුහුන් ඉසව්වක් (මාර්ගගත හා භෞතික ක්‍රියාකාරකම් සහිත) ලෙස පැවැත්විණි.
පරිසර පද්ධති හවුල්කරුවෙකු ලෙස වැඩසටහනට සම්බන්ධ වූ ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය නව්‍යකරණ ඇගයීමේ නිර්ණායක සංවර්ධනය කිරීමට සහාය වූ අතර අදාළ IP කළමනාකරණය සහ තාක්ෂණික හුවමාරු ක්‍රියාවලියේදී අයදුම්කරුවන්ට මග පෙන්වීය. මෙම උත්සවය ජුනි 29 වන දින ආරම්භ කරන ලදි.


### ASPAC කාන්තා නව්‍යකාරකයන් සහ ව්‍යවසායකයින්ගේ වැඩසටහන: අත්පත් කර ගැනීමේ සිට සවිබල ගැන්වීම දක්වා

ASPAC කාන්තා නව්‍යකාරකයන් සහ ව්‍යවසායකයින්ගේ වැඩසටහන සඳහා රටේ කේන්ද්‍රස්ථානය ලෙස ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය, ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ ආසියා සහ පැසිෆික් අංශය (ASPAC) සමඟ අත්වැල් බැඳ ගත්තේය. මෙම වැඩසටහන මගින් අදහස්වල සිට අත්හදා බැලීම් සහ ඔවුන්ගේ නව්‍ය අදහස් දියත් කිරීම, සංවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම දක්වා- පහසුවෙන් ජීර්ණය කළ හැකි, ප්‍රායෝගික තොරතුරු සමග, බුද්ධිමය දේපල කාව හරහා සාමාන්‍ය නව්‍ය/ව්‍යවසායක ගමනක විවිධ අවධීන් හරහා සහභාගිවන්නන් රැගෙන යනු ඇත. පළමු පියවර ලෙස, 2022 ජුනි 1 සිට 2022අගෝස්තු 3 දක්වා සෑම බදාදා දිනකම අන්තර් ක්‍රියාකාරී පැය 1 ක අතථ්‍ය සැසිවාරයක් WIPO සහ කලාපයේ ප්‍රවීනයන් සමඟ වේගවත් උපදේශනය, ගැලපීම් ක්‍රියාකාරකම්, ජාලකරණය සහ වැඩමුළු ඇතුළත් දැනුම හුවමාරු සංසදයක් ලෙස පැවැත්විණ. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කාන්තා ව්‍යවසායිකාවෝ සහ නව්‍යකාරකයෝ තිස් දෙනෙක් මෙම වැඩසටහනට එක් වූහ.

## බුද්ධිමය දේපල තක්සේරු කිරීම (IP into Rupees)

### බුද්ධිමය දේපල රුපියල් බවට

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ පළමු අයිඑස්බීඑන් ප්‍රකාශනය, IP to Rupees - *ආර්ථිකයේ පෙරළිකරු* 2022 ජූනි මාසයේදී එළි දැක්විණ.
රටේ ආර්ථිකය ඉහළ නැංවීම සඳහා අස්පර්ශනීය වත්කමක් ලෙස බුද්ධිමය දේපලවල විභවය දක්වන මෙම වාර්තාව රටේ නිර්මාණශීලීත්වයට සහ නව්‍යකරණයට වටිනාකමක් එක් කිරීම සඳහා "ශ්‍රී ලාංකික සැලැසුම් නිර්මාණය" යන සංකල්පය හඳුන්වා දෙයි. තවද, සංවර්ධිත රටවල් තම ආර්ථිකයන් ඉහළ නැංවීම සඳහා අස්පර්ශනීය වත්කම් භාවිතා කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දෙයි.




කෙසේ වෙතත්, ඒවායින් බොහොමයක් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහළ නැංවීම සඳහා අස්පර්ශනීය වත්කමක් ලෙස හඳුනාගෙන නොමැත. ආර්ථිකයේ විභවය හඳුනා ගැනීමෙන් ආර්ථිකයට සහාය වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ යුතුය.

නව්‍යකරණ ක්‍රියාවලියේ අස්පර්ශනීය වත්කම් සමඟ ආර්ථිකයට ධනාත්මක පරිවර්තනයක් සැපයීම සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) විභව IP වත්කම් සිතියමක් සහ නව්‍යකරණ කැන්වසය හඳුනාගෙන සංවර්ධනය කර ඇත. සිතියමේ සහ කැන්වසයේ අංගය ඵලදායී ලෙස දිශාගත කිරීම IP වත්කම් ලබාගැනීමට සහ මධ්‍යම ආදායම් උගුලෙන් ගැලවීමට සහාය වේ.

වැදගත් වන්නේ ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය වත්කම් රුපියල් බවට පත් කිරීමේ සංකල්පය වන "ශ්‍රී ලාංකික නිර්මාණ සැලසුම්" සංකල්පය ලෝකයට හඳුන්වා දීමයි.

### ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හමුවීම

බොහෝ සංවර්ධිත රටවල අස්පර්ශනීය වත්කම් සඳහා ආයෝජනය වැඩි වෙමින් පවතී. ඒ අනුව, ආර්ථිකය සඳහා නව වර්ධන ප්‍රභවයන් සඳහා අස්පර්ශනීය වත්කම් සමුච්චය කිරීමට උපකාරී වීම උදෙසා ගෝලීය ආර්ථික තත්ත්වයේ ප්‍රධාන ක්‍රියාකාරිකයන් ප්‍රතිපත්තිමය වෙනස්කම් හා සිය සහයෝගය කෙරෙහි නව අවධානයක් යොමු කර ඇත. මෙය රටෙහි අස්පර්ශනීය වත්කම් සඳහා ආයෝජනය කිරීම මත රඳා පවතී. තවද, ඉහළ අගය එකතු කළ ක්‍රියාකාරකම්වල සාර්ථක වීමට අවශ්‍ය අස්පර්ශනීය වත්කම් සංවර්ධනය

කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින් උත්සාහ කරන ආර්ථිකයන් කෙරෙහි මෙය අවධානය යොමු කරනු ඇත.

මෙම පසුබිම තුළ, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා වෙත අස්පර්ශනීය වත්කම් පිළිබඳ වාර්තාව භාර දුන් අතර, නවෝත්පාදනයන් මත පදනම් වූ ආර්ථිකයක් සඳහා අස්පර්ශනීය වත්කම් ආර්ථික දර්ශකයක් ලෙස සැලකීම සඳහා මූලික සාකච්ඡාව පැවැත්විණි. ශ්‍රී ලංකාවේ නවෝත්පාදන පරිසර පද්ධතිය ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිත කළ හැකි ගෝලීය නවෝත්පාදන දර්ශකය කෙරෙහි ද මෙම කණ්ඩායම අවධානය යොමු කළේය.



*(වමේ සිට දකුණට: මහාචාර්ය අජිත් ද අල්විස්, ආචාර්ය නන්දලාල් වීරසිංහ, තිදසි දහනායක මහත්මිය, වින්ධ්‍යා විජේසිංහ මහත්මිය සහ නවෝදි වික්‍රමසිංහ මෙනෙවිය)*

## NIA බුද්ධිමය දේපල දිනය සැමරීම

ලෝක බුද්ධිමය දේපල දින සැමරුමට සමගාමීව ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය විසින් 2022 අප්‍රේල් 28 වන දින "වඩා හොඳ අනාගතයක් සඳහා බුද්ධිමය දේපල සහ නවෝත්පාදනය කරන යෞවනය - ශ්‍රී ලංකා යෞවනය ඔබ සූදානම්ද?" තේමාව යටතේ අන්තර්ජාලීය සමුළුවක් පවත්වන ලදි. ජාතික බුද්ධිමය දේපල කාර්යාලය (NIPO), මොරටුව විශ්ව විද්‍යාලයයේ ව්‍යවසාය/විශ්ව විද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා අංශය සහ ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ ආසියා පැසිෆික් අංශය (WIPO), NIA සමග මෙම අවස්ථාවට එක්ව සිටියහ. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ප්‍රධාන නවෝත්පාදන නිලධාරී මහාචාර්ය අජිත් ද අල්විස්, ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ ආසියා සහ පැසිෆික් කලාපයේ අධ්‍යක්ෂ ඇන්ඩෲ මයිකල් ඕං, ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ගීතාංජලී රණවක, මොරටුව විශ්ව විද්‍යාලයයේ, ව්‍යවසාය, විශ්ව විද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා අංශයේ අධ්‍යක්ෂ ආචාර්ය අජිත් පැස්කුවල්, අනුක්‍රමික නවෝත්පාදක සහ ව්‍යවසායක, තුරු හි සම නිර්මාතෘ ඉංජිනේරු හේමින්ද ජයවීර සහ සීමාසහිත හේලිස් ෆැබ්රික් පෞද්ගලික ආයතනයේ නිර්මාණ හා නවෝත්පාදන ජ්‍යෙෂ්ඨ විධායක උෂානි හේවගේ යන මහත්ම මහත්මීහු විද්වත් කණ්ඩායම නියෝජනය කළහ.







**ඉන්දියාවේ ආන්ද්‍රා විශ්ව විද්‍යාලයයේ බුද්ධිමය දේපල දින සැමරුම:**

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය, 2022 අප්‍රේල් 26 වන දින ඉන්දියාවේ ආන්ද්‍රා විශ්ව විද්‍යාලයය විසින් සංවිධානය කරන ලද ලෝක බුද්ධිමය දේපළ දිනය සැමරුමේ සම සංවිධායකයෙක් විය. NIA හි ප්‍රධාන නව්‍යකරණ නිලධාරී මහාචාර්ය අජිත් ද අල්විස් මෙම අවස්ථාවට ආරාධිත කථිකයෙකු ලෙස සහභාගී විය.







## ජාතික නව්‍යකරණ පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම

**වත්මන් අර්බුදය ජය ගැනීමට ශ්‍රී ලංකාවට සහාය වීම සඳහා NIA සම්මන්ත්‍රණ මාලාව**

2022 දී ශ්‍රී ලංකාව බලශක්තිය, ප්‍රවාහනය, ඉන්ධන, ආහාර සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ වෙනත් බොහෝ ගැටලුවලට මග පාදමින් දරුණුතම ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නේය. නව්‍යකරණය තුළින් මේ තත්ත්වය ජය ගැනීම සඳහා විසඳුම් සෙවීමේ උත්සාහයක් ලෙස, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය මෙම එක් එක් ප්‍රධාන ගැටලු පිළිබඳ සංසද මාලාවක් පැවැත්වීමට තීරණය කළ අතර, විශේෂඥයන්, ක්‍රියාකාරීන්, පාර්ශ්වකරුවන් සහ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ඔවුන්ගේ අදහස් සහ අදහස් හුවමාරු කර ගැනීමට ආරාධනා කළේය. ඒ අනුව, උනන්දුවක් දක්වන බොහෝ පුද්ගලයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් ජීවවායු පිළිබඳ සාර්ථක සංසදයක් පැවැත්විණි.

## NIA - ජීවවායු සංසදය

මෙය NIA සංසද මාලාවේ පළමු වැඩසටහන විය. වර්තමාන ආර්ථික හා බලශක්ති අර්බුදයත් සමඟ පුරවැසියෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුව සඳහා විකල්ප සොයමින් සිටිති. ජීවවායු භාවිතය මහජනතාවගේ ලොකු අවධානයක් දිනාගෙන තිබේ. දහන වායු අර්බුදයට තිරසාර විසඳුමක් ලබාදීම සඳහා ජීවවායු සංසදය කැඳවනු ලැබීය. පර්යේෂණ හා සංවර්ධන සහ නියාමන අධිකාරීවරු, කර්මාන්ත සහ නිෂ්පාදකයෝ, බැංකු සහ මූල්‍යකරණයේ නියුතු වූවෝ, ගෘහ නිර්මාණ ශිල්පීහු සහ නව නිපැයුම්කරුවෝ ආදී හඳුනාගත් වැදගත් පාර්ශවකරුවෝ මෙම සංසදයට සහභාගී වූහ. ජීවවායු නිෂ්පාදකයෝ රටේ විදේශ විනිමය සීමාව හේතුවෙන් ඇති වී ඇති වර්තමාන තත්ත්වය සහ ගැටලු පිළිබඳව කතා කළහ. තාක්ෂණික ගැටළු කිහිපයක් සහ ප්‍රමිතිකරණය සහ නියාමන ගැටලු මතු කර සාකච්ඡා කරන ලදි. ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා බැංකු අංශය කැමැත්ත ප්‍රකාශ කළේය. ක්‍රියා කළ හැකි අවස්ථා 25 ක් හඳුනාගෙන ඇති අතර NIA මේවා නව්‍යකරණයෙන් විසඳීමට බලාපොරොත්තු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් රසායනික බැරල් මුදා හැරීම සඳහා නිසි අනුමැතිය ලබා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා ආරම්භ කළ අතර සාකච්ඡා සාර්ථකව ප්‍රගමනය විය. දැන් එය ක්‍රියාත්මක කිරීමේ අවසන් අදියරේ පවතී.

මේ අතර, තිරසාර බලශක්ති උත්පාදනය සඳහා මෙම තාක්ෂණයේ විභවය මෙන්ම කාබනික පොහොර සඳහා හොඳ ප්‍රභවයක් වන ජීවවායු භාවිතයට සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ***DFCC බැංකුව*** NIA සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය. තඹුත්තේගම සහ නාත්තන්ඩිය ප්‍රදේශවල ගොවි ජනතාව ඉලක්ක කර ගනිමින් මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙනු ඇත. මීට අමතරව, පළමු වරට නාගරික පදිංචිකරුවන්ට ශුන්‍ය පොලී ගෙවීමේ යෝජනා ක්‍රමයක් සහිත ජීවවායු ඒකක ක්‍රෙඩිට් කාඩ්පත් හරහා මිලදී ගැනීමේ විකල්පය තිබිය හැකිය.






# DFCC Bank-NIA partner to support biogas technology adoption

DFCC Bank, Sri Lanka's pioneer in financing renewable energy, has joined hands with the recently established National Innovation Agency (NIA), which was enacted by the parliamentary Act No. 22 of 2019, to promote biogas technology, as the agency's financial services provider and to create broader awareness about this sustainable alternative.

From left: DFCC Bank PLC Assistant Vice President Marketing and Sustainability Senaka Jayasinghe, DFCC Bank PLC Assistant Vice President MSME Chandana Wanigasena, DFCC Bank PLC Senior Vice President Offshore Banking, Remittances and Business Development Anton Arumugam, NIA Chief Innovation Officer Prof. Ajith de Alwis, NIA Innovation Officer Dr. Sachie Panawala and NIA Innovation Officer Navodi Wickramasinghe

Discussing the benefits and strengths of the technology, NIA Chief Innovation Officer Prof. Ajith de Alwis said, "Biogas has a triple benefit as waste becomes raw material, hence accomplishing recycling and sustainable disposal, while the output derived from that waste is transformed into a sustainable energy source and can also be used as an organic fertiliser. Therefore, this process stands unique as the only process that does not generate waste but instead uses waste as the input." "At the larger community and social level, it can help reduce energy costs and our carbon footprint while providing an effective and efficient method of waste disposal, often onsite or in the nearby vicinity. We hope to see this technology promoted further and popularised, which is why we have partnered with DFCC Bank," he added.


*වමේ සිට දකුණට (DFCC මාණ්ඩලික) - සේනක ජයසිංහ මහතා සහකාර උප සභාපති - තිරසාරභාවය, චන්දන වනිගසේන මහතා - MSME සහකාර උප සභාපති, ඇන්ටන් අරුමුගම් මහතා, ජ්‍යෙෂ්ඨ උප සභාපති - අක්වෙරළ බැංකු, ප්‍රේෂණ හා ව්‍යාපාර සංවර්ධන, (NIA මාණ්ඩලික) මහාචාර්ය අජිත් ද අල්විස් මහතා - ප්‍රධාන නව්‍යකරණ නිලධාරී (වැඩ බලන), වෛද්‍ය සචී පනාවල මිය– අතිරේක ප්‍රධාන නව්‍යකරණ නිලධාරි, නවෝදි වික්‍රමසිංහ මෙනෙවිය – ජ්‍යෙෂ්ඨ නව්‍යකරණ නිලධාරි*

## NIA - ජෛව ඩීසල් සංසදය

NIA බොහෝ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් ජෛව ඩීසල් පිළිබඳ සමාන සංසදයක් පැවැත්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස පද්ධතියේ අඩුවක් ලෙස හඳුනාගත් ජෛව ඩීසල් සඳහා ප්‍රමිති සකස් කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ඉල්ලා සිටින ලදි.

## NIA – ආහාර සුරක්ෂිතතා සංසදය

ආහාර සුරක්ෂිතතා අතථ්‍ය සංසදය මෙම විෂය පිළිබඳ පාර්ශවකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ විශේෂඥයන්ගේ සහභාගීත්වයෙන් NIA විසින් පවත්වන ලදි.



**දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම**

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය සහ සුහුරු අනාගතයක් සඳහා මධ්‍යස්ථානය සමග අවබෝධතා ගිවිසුම**

ජාතික නව්‍යකරණ පරිසර පද්ධතිය සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය සහ සුහුරු අනාගතයක් සඳහා වූ මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

සුහුරු අනාගතයක් සඳහා මධ්‍යස්ථානය යනු කොළඹ මූලස්ථානය කරගත් අතථ්‍ය චින්තන පර්ෂදයක් වන අතර එය ප්‍රධාන වශයෙන් ආර්ථික වර්ධනය සහ තරඟකාරිත්වය, විද්‍යාව හා තාක්ෂණය, පාරිසරික තිරසාරභාවය, නාගරීකරණය සහ නගර සහ ජාත්‍යන්තර වෙළඳාම යන ප්‍රධාන තේමා පහක් කෙරෙහි අවධානය යොමු කරයි.



*මහාචාර්ය අජිත් ද අල්විස් මහතා සහ අනුෂ්ක විජේසිංහ මහතා අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම*

මෙම සහයෝගීතාව තුළින්, නව්‍යකරණ හා ව්‍යවසායක උපායමාර්ගය සක්‍රීය කිරීම සහ ගෝලීය දර්ශකවල, විශේෂයෙන් ගෝලීය නව්‍යකරණ දර්ශකයේ (GII) ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම හා සම්බන්ධ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය සැලසුම් කරයි.

සුහුරු අනාගතයක් සඳහා වූ මධ්‍යස්ථානයේ සම-නිර්මාතෘ අනුෂ්ක විජේසිංහ සහ NIA හි ප්‍රධාන නව්‍යකරණ නිලධාරී මහාචාර්ය අජිත් ද අල්විස් යන මහත්වරු මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

**කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා NEDA සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම**

කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම සඳහා SMEconect ඩිජිටල් වේදිකාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) සමඟ (www.smeconnect.lk) ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය අත්වැල් බැඳ ගත්තේය.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) සිය "කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ණය ව්‍යාපෘතිය" යටතේ SME සම්බන්ධතාවය සංවර්ධනය කර ඇත. මෙම වේදිකාවේ විෂය පථය මූල්‍ය හා ව්‍යාපාරික ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම තුළින් කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස් පරිදි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව නෙඩා ආයතනයට පැවරී ඇත. මෙම වේදිකාව සියලුම ව්‍යවසායකයන් සඳහා විවෘත වන නමුත් කාන්තා ව්‍යවසායිකාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉගෙනීම, උපදේශනය සහ ජාලකරණය සම්බන්ධයෙන් සහාය ලබා දේ.

WIPO සමඟ දියත් කිරීමට නියමිත එහි සමාජ නව්‍යකරණ කුලුන සහ කාන්තා නව්‍යකරණ හා ව්‍යවසායකත්ව වැඩසටහන යටතේ මෙම වේදිකාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට NIA අපේක්ෂා කරයි.

**NIA සමඟ Citra හමුව**

NIA හි සමාජ නව්‍යකරණ කුලුනෙහි ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යාම සඳහා NIA කණ්ඩායම සහ Citra සමාජ නව්‍යකරණ විද්‍යාගාරය සැලසුම් කිරීමේ සැසියක් පැවැත්වූහ.

Citra යනු ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වන අතර ඒකාබද්ධ මුලපිරීමක් ලෙස පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ පළමු සමාජ නව්‍යකරණ විද්‍යාගාරයයි. එය සංවර්ධන විසඳුම් සහ මූලාකෘති රට පුරා ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා කාර්යක්ෂම හා පරිපූර්ණ බව සහතික කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා මානව කේන්ද්‍රීය සැලසුම් ද ඉදිරි දැක්ම සහ නව්‍යකරණ මෙවලම් ද භාවිත කරයි. Citra විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් ගැටළු වෙත ළඟා වීමට හිතකර පරිසරයන්ට පහසුකම් සපයන අතර පුළුල් හා තිරසාර සංවර්ධන විසඳුම් ලබා දෙයි.

## නව්‍යකරණයට අදාළ ජාත්‍යන්තර සබඳතා සම්බන්ධීකරණය හා සහයෝගීතාව


**“ශ්‍රී ලංකාවේ නව්‍යකරණ පදනම් කරගත් සංවර්ධනය සඳහා උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම: අනාගතය සඳහා සැලසුමක්”**

“ලෝකයම අවුල්ජාලයක් බවට පත් වී ඇත. ප්‍රවෘත්ති නරඹන ඕනෑම කෙනෙකුට මෙය පැහැදිලි විය යුතුය. ගෝලීය අභියෝගවල එකතුවක් — සන්නද්ධ ගැටුම්, අසාර්ථක රාජ්‍යයන්, දේශගුණික විපර්යාස, වසංගත සහ මහා සංක්‍රමණ මේ සියවසේදී ඒකාබද්ධ වෙමින් පවතී. මෙම අභියෝගවල මූලික ක්‍රියාකාරීන් අතර සංවර්ධනය වෙමින් පවතින රටවල් සිය ආර්ථිකයන් වෙළඳ භාණ්ඩ, සංචාරක කර්මාන්තය සහ පහත් මට්ටමේ නිෂ්පාදන සිට විද්‍යාව, තාක්ෂණය සහ නව්‍යකරණය දක්වා විවිධාංගීකරණය කිරීම සඳහා නිදන්ගත අසමත් වීමකි; ඔවුහු අනිවාර්යයෙන් ම පශ්චාත් යටත් විජිත ප්‍රචණ්ඩත්වයක සිරවී සිටිති. ශ්‍රී ලංකාව දේශපාලන හා සමාජ ප්‍රතිවර්තන දිනපතා තීව්‍ර වෙමින් අසාර්ථක රාජ්‍ය තත්ත්වය කෙරෙහි අවධානය යොමු කරමින් බිඳෙන සුළු රාජ්‍යයක් බවට පත්ව ඇති හෙයින් සිද්ධි අධ්‍යයනයක් බවට පත්ව ඇත" යි නිව් හැම්ප්ෂයර් විශ්ව විද්‍යාලයේ ෆ්‍රැන්ක්ලින් පියර්ස් නීති විද්‍යාලයේ මහාචාර්ය ස්ටැන් කොවාල්ස්කි පවසයි.

තම විශ්වවිද්‍යාල වැඩසටහන වන"ජාත්‍යන්තර තාක්ෂණ හුවමාරු ආයතන සායනය (ITTI)" යටතේ “ශ්‍රී ලංකාවේ නව්‍යකරණ මත පදනම් වූ සංවර්ධනය සඳහා උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක්: අනාගතය සඳහා සැලසුමක්” සැකසීම සඳහා ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව පර්යේෂණ කිරීමට ඔහු සිය සිසුන් හය දෙනෙකුගෙන් යුත් කණ්ඩායම සමඟ එක්ව කටයුතු කරනු ඇත. මෙම අධ්‍යයනයේ කේන්ද්‍රස්ථානය ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය වන අතර ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ ආසියා සහ පැසිෆික් අංශය මෙම ව්‍යාපෘතිය සඳහා පහසුකම් සපයයි.



*මහාචාර්ය ස්ටැන් කොවැල්ස්කි*




මහාචාර්ය ස්ටැන්ලිට අනුව අප රට විද්‍යාව, තාක්ෂණය සහ නව්‍යකරණයන්හි උපායමාර්ගික ධාරිතාව ගොඩනැගීමේ ආයෝජනයේ ඇති ප්‍රබලත්වය හඳුනා නොගෙන වසර ගණනාවක් නාස්ති කර ඇත. එබැවින් නව්‍යකරණයන් සඳහා වන යෝජිත උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මෙම යථාර්ථය ආමන්ත්‍රණය කර රටේ සංවර්ධනය වේගවත් කරනු ඇත. මෙම සැලැස්මේ ප්‍රධාන අංග වනුයේ බුද්ධිමය දේපල නීතිය, ප්‍රයෝගික සහ කළමනාකරණය සහ ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධනයේ අදියරට අදාළ වන පරිදි තාක්ෂණ හුවමාරුවේ හොඳම භාවිතයන් ය.

මහාචාර්ය ස්ටැන්ලි පැවසුවේ “ස්පර්ශ කළ හැකි භාණ්ඩ, සේවා සහ වෙළඳ භාණ්ඩ ඉක්මවා යන


ජාත්‍යන්තර වෙළඳාමේ සහ ගනුදෙනු වල අස්පර්ශනීය බුද්ධිමය වත්කම්වල වටිනාකම වැඩි බවයි. මෙය සාකච්ඡා, බලපත්‍ර ලබා දීම, පර්යේෂණ හා සංවර්ධන සහයෝගීතාවයන් හෝ තාක්ෂණ හුවමාරුවට සම්බන්ධ වුවද සංස්කෘතීන් හරහා සන්නිවේදනය කිරීමේ අතිශයින් සංකීර්ණ කුසලතා අවශ්‍ය බව තේරුම් ගැනීමේ කෙටි පිම්මක් පමණි. මෙම ගෝලීයකරණය වූ නව්‍යකරණ වෙළඳපොළට සම්බන්ධ වීම සඳහා ශ්‍රී ලංකාව වහාම මානව ප්‍රාග්ධනය සහ ආයතනික යටිතල පහසුකම් ගොඩනඟා ගත යුතුය.”

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලය රටේ තීරණ සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දැස් විවර කර සෞඛ්‍යය, කෘෂිකර්මාන්තය, බලශක්තිය සහ නිෂ්පාදනය යන තීරණාත්මක නව්‍යකරණයන් බවට පත්වන තාක්ෂණික සංරචක හඳුනා ගැනීම, ප්‍රවේශ වීම, අවශෝෂණය කර ගැනීම, අනුවර්තනය වීම සහ එකලස් කිරීම සිදු කරනු ඇතැයි ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය බලාපොරොත්තු වේ. මෙය සමෘද්ධිය, යහපැවැත්ම සහ දීප්තිමත් අනාගතයක් සඳහා බලාපොරොත්තුව ඇති කරයි.

## WIPO හි ආසියා සහ පැසිෆික් කාන්තා නව්‍යකාරක සහ ව්‍යවසායක වැඩසටහන

ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ ආසියා සහ පැසිෆික් අංශය "ආසියා සහ පැසිෆික් කාන්තා නව්‍යකාරක සහ ව්‍යවසායක වැඩසටහන" යටතේ කාන්තා ව්‍යවසායිකාවන් සැලසුම් කිරීම, බුද්ධිමය දේපල කළමනාකරණය, ඩිජිටල්අලෙවිකරණය, වාණිජකරණය යනාදිය පිළිබඳ පුහුණු කිරීම සඳහා වෙබිනාර් මාලාවේ පළමු අදියර 2022 ජුනි සිට අගෝස්තු දක්වා පවත්වා අවසන් කළේය. ඉන්දියාව, වියට්නාමය සහ මැලේසියාව යන රටවල සහභාගිවන්නන් සමඟ ශ්‍රී ලාංකික නියෝජිතයෝ තිස් දෙනෙක් (30) මෙම අවස්ථාවට එක්ව සිටියහ. NIA මෙම වැඩසටහන සඳහා රටේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කළේය.

මෙම වැඩසටහනේ දෙවන අදියර ලෙස “ශ්‍රී ලාංකික කාන්තා ව්‍යවසායිකාවන් සඳහා නව්‍යකරණ හා ව්‍යවසායකත්ව උපදේශන වැඩසටහන” නොවැම්බර් පළමු සතියේදී ආරම්භ කෙරේ. වැඩසටහනේපළමු අදියරෙන් තෝරාගත් කාන්තා ව්‍යවසායකයන් 10-15 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් මෙම අවස්ථාවට සහභාගී වනු ඇත. මෙය නව්‍යකරණ හා ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ WIPO සහ දේශීය විශේෂඥ උපදේශකයින් විසින් මුහුණට මුහුණ පවත්වනු ලබන උපදේශන සැසියකි.




## ප්‍රතිපත්ති-සඳහා-දත්ත වේදිකාව: ඉගෙනීම සහ ක්‍රියා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ ප්‍රජාවක්

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ රොක්ෆෙලර් පදනම එක්ව, ප්‍රාදේශීය නව්‍යකරණ

මධ්‍යස්ථානය විසින් පහසුකම් සපයන ලදුව 2022 ඔක්තෝබර් 17 වන දින ප්‍රතිපත්ති සඳහා දත්ත වේදිකාව දියත් කළෝය. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය - ශ්‍රී ලංකාව ඇතුළු ආසියා පැසිෆික් කලාපය පුරා ප්‍රතිපත්ති සම්පාදකයින්ට ප්‍රතිපත්ති සඳහා දත්ත අත්හදා බැලීම් පිළිබඳ සිය ඉගෙනුම් චාරිකා බෙදාහදා ගැනීමට ආරාධනා කර තිබිණි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ වෛද්‍ය සචී පනාවල මහත්මිය මෙම සංවාදයට සහභාගී වූවා ය.




## NIA කවය දියත් කිරීම

ජාලකරණය සහ සහයෝගීතාව නව්‍යකරණ පරිසර පද්ධතිය ගොඩනැගීමේ ප්‍රධාන අංග වේ. ලොව පුරා සිටින, ශ්‍රී ලංකාවේ නව්‍යකරණ මෙහෙයුමට සහාය වීමට කැමැත්තක් දක්වන ප්‍රවීනයන් සම්බන්ධ කිරීම සඳහා NIA කවය පිහිටුවන ලදි.




ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන කවය (NIA කවය) ශ්‍රී ලංකාවේ නව්‍යකරණ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයට එක්වීම සඳහා නව්‍යකරණයන් සහ ව්‍යවසායකත්වය පිළිබඳ විශේෂඥතාවයක් ඇති පුද්ගලයින් සහ සංවිධාන (දේශීය හා ජාත්‍යන්තර) සාදරයෙන් පිළිගනී. NIA කවයට සම්බන්ධ වීමෙන් සමාන අදහස් ඇති පුද්ගලයින් සහ සංවිධාන සමඟ සම්බන්ධ වීමට සහ රටේ නව්‍යකරණ පරිසර පද්ධතියේ සංවර්ධනයට දායක වීමට අවස්ථාවක් ලබා දිය හැකිය.

## ශ්‍රී ලාංකික රසය හා ප්‍රඥාව මිශ්‍ර කිරීම

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය, MJF පුණ්‍යායතන පදනම, සීමාසහිත කොමර්ෂල් බැංකුව සහ ඩිල්මා තේ යන ආයතන හා එක්ව "තිරසාර සංවර්ධනය සඳහා මූලික විද්‍යාව" යන තේමාව යටතේ "ලෝක විද්‍යා දිනය" සැමරීම සඳහා ශ්‍රී ලංකාවේ පළමු "ගණිත කැෆේ" විවෘත කළේය.

මෙය කටුබැද්ද, ස්වශක්ති බේකරි සහ තේ ආපනශාලාවේ දී ගණිතමය ක්‍රීඩාවක නිරත වන අතරතුර ඔබට තේ කෝප්පයක් භුක්ති විඳිය හැකි නව සංකල්පයකි.

MathCafe යනු ශ්‍රී ලංකාවේ පාසල් දරුවන්ගේ ගණිතමය සහ විශ්ලේෂණ කුසලතා උත්තේජනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ නව මුලපිරීමකි. පස්සර මියෙනකඳුර රජයේ පාසලේ හිටපු ගුරුවරයෙකු මෙන්ම නව්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය නිර්මාණකරුවෙකු වූ එච්.ඒ.ධර්මසිරි මහතාගේ 'ගණිත විද්‍යාගාරය' සංකල්පයෙන් ලබා ගත් ප්‍රතිඵලවලින් ආභාසය ලබමින් කොමර්ෂල් බැංකුවේ වැඩසටහන ආරම්භ වූයේ රජයේ පාසල් හතරක සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ නිවසක සිසුන් 4500ක් සම්බන්ධ කරගත් නියමු ව්‍යාපෘතියක් ලෙසිනි.

Math Cafe සැලසුම් කර ඇත්තේ මෙම සංකල්පයේ පුරෝගාමියා විසින් සකස් කරන ලද මෙවලම් සහ ක්‍රම භාවිතා කරමින් අපගේ පාසල් පද්ධතිය තුළ විෂයය උගන්වන හා ඉගෙන ගන්නා ආකාරය කෙරෙහි තිරසාර බලපෑමක් ඇති කිරීමට ය.

අන්තර්ක්‍රියාකාරී ගණිත ක්‍රීඩා, ක්‍රීඩා මෙවලම් සහ රසවත් ක්‍රියාකාරකම් 70ක් හරහා දුෂ්කර න්‍යායන් ඉගෙන ගනිමින් සිසුන්ට ඔවුන්ගේ තාර්කික හා විශ්ලේෂණාත්මක චින්තන ශක්තිය මුදා හැරීමට පරිසරය, උපකරණ සහ උත්තේජක ලබා දීම සඳහා නිර්මාණය කර ඇති Math Cafe, සිසුන්ට ප්‍රායෝගික ගණිත ගැටළුවලින් ඇත්ත වශයෙන්ම අදහස් කරන්නේ කුමක්ද යන්නත් සංකීර්ණ ගණනය කිරීම් සහ සූත්‍රත් තේරුම් ගැනීමට උපකාර කිරීම සඳහා සරල හා ප්‍රියජනක ගණිත ක්‍රියාකාරකම් භාවිත කරයි. මෙම වැඩසටහන ගණිතමය ගැටලු විසඳීම සඳහා විශ්මයජනක සරල ශිල්පීය ක්‍රම පුහුණු කිරීමට සිසුන්ට මඟ පෙන්වයි.



## විද්‍යා සතිය සැමරුම





**තිරසර සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්ෂණය හා නව්‍යකරණය**
ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන කණ්ඩායම ජාතික විද්‍යා සතිය සැමරීමට සමගාමීව අද දෙරණ 24 විසින් විකාශය කරන ලද බිග් ෆෝකස් සජීවී වැඩසටහනට සහභාගී විය. නව්‍යකරණය, විද්‍යා සන්නිවේදනය සහ විද්‍යාව, විද්‍යා සාක්ෂරතාව ප්‍රචලිත කිරීමේ දී මාධ්‍යවල කාර්යභාරය සහ නවෝත්පාදනය, නව්‍යකරණය සහ වාණිජකරණය අතර පරතරය පිරවීමේදී ජාතික බුද්ධි ආයතනයේ කාර්යභාරය පිළිබඳව මෙහිදී සාකච්ඡා විය.

**ජෛව තාක්ෂණය සහ ව්‍යවසායකත්වය**
"ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිමත් වීම සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා අධි තාක් ෂණය පදනම් කරගත් තාක්ෂණික ව්‍යවසායකත්ව අවස්ථා" යන තේමාව යටතේ NIA වෙබිනාර් මාලාවක් GEW වෙතින් ආරම්භ කළ අතර ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC) සමඟ සහයෝගයෙන් "ජෛව තාක්ෂණය සහ ව්‍යවසායකත්වය" පිළිබඳ පළමු වෙබිනාර් සැසිය සාර්ථකව පැවැත්විය.
ශ්‍රී ලංකාවේ ජෛව තාක්ෂණ කර්මාන්තය සහ ශාස්ත්‍රාලය නියෝජනය කරන ඉතා කීර්තිමත් විද්වත් මණ්ඩලයකින් එය සමන්විත විය;

- සමුදිත් කුමාරසිංහ මහතා, Nature 's Beauty Creations Ltd හි අධ්‍යක්ෂ
- මහාචාර්ය ගාමිණී සෙනෙවිරත්න, ජාතික මූලික අධ්‍යයන ආයතනය
- වෛද්‍ය චන්ද්‍රනමාලි පුංචිහේවා, ප්‍රධාන විධායක නිලධාරී, ජීන්ලැබ්ස් වෛද්‍ය (පුද්ගලික) සමාගම
- දිලිප් ද සිල්වා මහතා ප්‍රධාන විධායක නිලධාරී, සෙරන්ඩිබ් උද්‍යාන තාක්ෂණ (පුද්) සමාගම
- ආචාර්ය තිළිනි ආරියදාස, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්ව විද්‍යාලයය

ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී අමාලි රණසිංහ මහත්මිය මෙම සැසිවාරය මෙහෙයවූවාය.



## ඉනොවේෂන් අයි - ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ කාර්තුමය පුවත් පත්‍රිකාව

අදාළ මාස තුන තුළ සිදු වූ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ සිදුවීම් ග්‍රහණය කර ගන්නා ඉනොවේෂන් අයි නම් ත්‍රෛමාසික ප්‍රවෘත්ති පත්‍රයක් NIA විසින් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව එය 2022 දී ඉනොවේෂන් අයි කලාප හතරක් ප්‍රකාශයට පත් කළේය.










**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම**

ආයතනික ව්‍යාපාර සම්බන්ධතා ඒකක (IBLC) යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල 17 තුළ දැනටමත් ස්ථාපිත කර ඇති යූබීඑල් ඒකක ක්‍රමය අනුගමනය කරමින් NIA විසින් සංවර්ධනය කරන ලද සංකල්පයකි. මෙම අදහසට අනුව, 2023 සිට රටේ පර්යේෂණ ආයතන 60 කට ආසන්න සංඛ්‍යාවකට IBLC පිහිටුවීමට NIA සැලසුම් කරයි.
ඊට සමගාමීව වැවිලි අමාත්‍යාංශයේ ලේකම් ජනක ධර්මකීර්ති මහතා සහ අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ ආයතන සඳහා නිසි තාක්ෂණය හුවමාරු කිරීම, වාණිජකරණය, නව්‍යකරණය සහ IPR කළමනාකරණය පිළිබඳව NIA සමඟ ඉතා සාර්ථක සාකච්ඡාවක් පැවැත්විණි. මෙහිදී, වැවිලි අමාත්‍යාංශය යටතේ ඇති සියලුම පර්යේෂණ ආයතන සඳහා තාක්ෂණ හුවමාරු ඒකක ලෙස ආයතනික ව්‍යාපාර සම්බන්ධතා ඒකක (IBLC) පිහිටුවීමට යෝජනා කරන ලදි. වැවිලි කර්මාන්ත යටතේ භාවිතයට නොගත් අනෙකුත් භෝග සඳහා භූගෝලීය දර්ශක (GI) ආරක්ෂා කිරීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරන ලදි. නිසි ආරක්ෂාවක් සහිතව වඩා හොඳ වටිනාකමක් එක් කිරීම සඳහා මෙම ආරම්භය රට තුළ වැවිලි කර්මාන්තයට නව දොරක් විවර කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.




## නව්‍යකරණ අනාගතයක් සඳහා තරුණ නායකයින්

WIPO IP සහ යෞවන වැඩසටහන යටතේ ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයට 2022 දී WIPO වෙබ් අඩවියේ සහ WIPO ආසියා පැසිෆික් ප්‍රවෘත්ති පත්‍රයේ සිද්ධි අධ්‍යයනයන් ලෙස තරුණ ව්‍යවසායකයන් සම්බන්ධීකරණය කිරීමට හැකි විය. ප්‍රදර්ශිත තරුණ ව්‍යවසායකයන් වූයේ ශිෂ්‍ය නෙතිල නිම්සත් ගමගේ, ඉංජිනේරු කීර්ති කොඩිතුවක්කු, හේලි සෙනෙවිරත්න මෙනෙවිය, ඒකාබද්ධ කෘෂි නිෂ්පාදන ලංකා (පුද්) සමාගම (JAPC), සෙනුරි ගමගේ මහත්මිය සහ ආචාර්ය හිමේෂ් ප්‍රනාන්දු මහතා ය.

ඔවුන්ගේ සාර්ථකත්වයේ පුවත් WIPO වෙබ් අඩවියෙන් ලබා දී ඇති සබැඳි හරහා කියැවිය හැකිය.

ශිෂ්‍ය නෙතිල ගමගේ



Promising Kidpreneur Teaches Children Entrepreneurship Skills

Machine Translation: English

About the company

Nethila Nimsath is nothing like a regular teenager. He just turned 13 but already has an entrepreneur's career. With the support of his father, he developed a large following on LinkedIn, is interviewing successful entrepreneurs on his YouTube Channel, and created a business academy for children and teenage candidate entrepreneurs.


When Nethila was 10, his father, Amithe Gamage, a branding strategist regularly hosting live shows on Facebook, asked him to participate in short videos. Nethila would ask a question and Amithe would provide a long answer.

"My father thought people would be amazed to see a child talking about business," Nethila said. He was offered 500 rupees per show. "I gladly accepted. I was 10 years old; I could not decline such an offer!" That was the start of Nethila's career.

In 2019, one of Amithe's friends who has a book club asked if Nethila would present a book to an adult audience. "I was a little bit nervous," said Nethila "because I was doing the presentation physically." Amithe realized that not only his precocious child was at ease in front of a camera, but also in front of people. "I did the presentation very well and my dad took me for a pizza as a treat after that," said a smiling Nethila.

https://www.wipo.int/ipadvantage/en/details.jsp?id=1474

ඉංජිනේරු කීර්ති කොඩිතුවක්කු



Jendo – Heart Disease Prediction using Machine Learning

Machine Translation: English

About the company

*Preventing Cardiovascular Diseases with an AI-Powered Rapid Diagnostic Test*

Keerthi Kodithuwakku is a biomedical engineer, the co-founder and CEO of Jendo Innovations, a bio-medical startup delivering patented healthcare solutions detecting abnormalities in the cardiovascular system and seeking to prevent the risk of cardiovascular diseases.

His strong passion for biomedical engineering resisted adverse advice from some senior advisors in the healthcare industry about the lack of prospects in biomedical engineering in Sri Lanka. Along with a like-minded group of engineers, he followed his dream of providing a solution to help solve medical conditions. In their research and entrepreneurial journey, Keerthi said that he found strength and motivation through the strong support of his wife, family, friends, and coworkers in overcoming the obstacles faced when developing Jendo Innovations.

"We went through a lot of medical problems and we identified a new technology to detect endothelial dysfunction which is an early detection of cardiovascular diseases," he recalled. The endothelium describes the deepest cell layers of blood vessels. It was just a concept at that time, Keerthi said, "but going through the literature, we realized cardiovascular diseases (CVDs) are a huge health issue, and the technology would apply to all people in the world." "We were inspired by that, and that was the original idea of Jendo." According to the World Health Organization, (CVDs) are the leading cause of death globally and claim millions of lives a year.

Keerthi Kodithuwakku, CEO of Jendo Innovations (Photo: Jendo Innovations)

https://www.wipo.int/ipadvantage/en/details.jsp?id=12463

## ජොයින්ට් ඇග්‍රි ප්‍රොඩක්ට්ස්

### Joint Agri Products Ceylon's Organic Spices

Machine Translation: English

About the company

What is life without a little spice? Vernon Abeyratne, CEO of Joint Agri Products Ceylon (Pvt) Ltd (JAPC) could not agree more. The company is one of the largest exporters of Sri Lankan spices to the European and North American markets. Among its lead products, Ceylon cinnamon has gained worldwide recognition with a certification mark and has become a geographical indication in Europe.




For most of his career, Vernon worked for private export companies as well as for the Sri Lanka state Trading Consolidated Exports Corporation as a senior export executive. As such, he traveled to many countries and participated in trade fairs in Europe and the United States.

In 1993, he decided to start his own company. With the help of a trusted and faithful client who provided his first steady stream of orders and the support of local suppliers who agreed to provide credit facilities. He gathered six shareholders to bring up some seed funding, and after four months started exporting spices and expanding the business.

From his modest start with five employees, Vernon, the Managing Director and Chairman of the company runs the business with his son and provides work to over 200 permanent staff. Joint Agri Products Ceylon (Pvt) Ltd (JAPC) exports products for a value over US$ 10 million per year. The

https://www.wipo.int/ipadvantage/en/details.jsp?id=12653

## හේලි සෙනෙවිරත්න මෙනෙවිය

### Fortigrains Lanka Fortified Rice - a Solution to World Hunger

Machine Translation: English

About the company

*New Fortified Rice in Sri Lanka Could Offer Worldwide Relief for Micronutrient-Depleted Populations*

Haily Senevirathne was always interested in science and as a child dreamed of working in a research laboratory. Some years later, she is a researcher and the co-inventor of a patented process able to fortify rice with vitamins, minerals, and micronutrients, and has the potential to help the malnutrition plague in the world.

With a master's in science and technology, Haily went on to study nutrition for her master's and, passionate about her subject, started her own small research lab at her home after her study to do independent research and development for the industry. She later joined the Wayaba University of Sri Lanka as a Lecturer.



Rice is a staple food in Sri Lanka and many developing countries. Half of the world's population relies on rice, she said. However, rice loses most of its nutritional value during processing, in particular when the bran layer is removed during polishing to satisfy the market demands for white rice. What remains, Haily said, is mainly starch without many nutritional benefits, and developing country populations usually suffer from acute micronutrient deficiency of essential vitamins and minerals such as vitamin A, Vitamin Bs, Iron, and Zinc. When it comes to rice fortification, Haily explained, there are different technologies: bio-fortification, which involves gene modification, pre-harvest fortification, and post-harvest fortification, including dusting, coating, and extrusion. However, most of those technologies have not achieved the expected results, with recognized drawbacks, such as uneven distribution of fortificants leading to potential overconsumption or under consumption of fortificants, low retention rates due to pre-cook washing, and segregation of fortified rice kernels during handling,

https://www.wipo.int/ipadvantage/en/details.jsp?id=12636

## සෙනුරි ගමගේ මහත්මිය

### Savour Route Pure Ceylon Cinnamon

Machine Translation: English

About the company

*Traditional Knowledge Preserves the Unique Taste and Quality of True Ceylon Cinnamon*

Ceylon Cinnamon has been known for centuries and is thought to have been used as far back as ancient Egypt for its preservative and medicinal properties. Sri Lanka is the largest global exporter of cinnamon and hosts several SMEs producing the spice following traditional methods. Savour Route is one of them, headed by Senuri Gamage, a young entrepreneur, who combines ancestral methods of producing high-quality Ceylon Cinnamon, with a highly qualified staff, and her determination to provide jobs to women.

After graduating with a Bachelor's in international business in Malaysia, Senuri was not really attracted by the idea of a 9-5 job. She always planned to start her own business.

She started by conducting extensive market research on cinnamon. "During my research, I fell in love with the processing of cinnamon," she said. "I was amazed to see how complicated it is, and how beautiful it is." "I wanted to tell the world because not many people know the technicalities involved in that process and how much skill is needed to make a small cinnamon stick."




Senuri also found that even though Sri Lanka is the largest exporter of Cinnamon, there was a gap in quality. She decided that she would favor a small production, with high quality, aroma, and flavor. "I wanted to be an advocate, to increase cinnamon's value," she explained. She founded Savour Route in January 2020, at the brink of the Covid-19 pandemic, which prevented any exports until October

https://www.wipo.int/ipadvantage/en/details.jsp?id=12639

## ආචාර්ය හිමේෂ් ප්‍රනාන්දු

### Chakra Suthra Zero-Waste Solutions

Machine Translation: English

About the company

*Bringing Homes and Businesses in Sri Lanka to Zero-Waste Production*

Most of the packaging in Sri Lanka ends up in landfills, polluting the earth and water. Himesh Fernando, the founder, and CEO of Chakra Suthra is set on reversing the trend and driving homes and businesses in the country towards a zero-waste practice.

The name of the company comes from Sanskrit: Chakra (circular), and Suthra (formula); the circular solution.



Himesh is a native of Matara, a coastal city in the South of the island where he grew up. Coming from a scientific family with a pediatrician father and a mother who was a nurse, he was always fascinated by science. "We always talked about science, and at one point I wanted to be a doctor, but that did not happen."

He chose to study molecular biology and biochemistry at the University of Colombo before going to the United Kingdom on a scholarship to follow a Ph.D. program in genetics and molecular biology.

After his Ph.D. he worked for some biotech companies in Oxford, concentrating first on research, and further focusing on the business side of science. Some ten years ago, he came back to Sri Lanka to work on the commercialization of innovation.

In 2018 Himesh was selected for a three months Eisenhower Fellowship for Innovation and traveled to the United States to work on a social impact-related project. This fellowship was an opportunity to

https://www.wipo.int/ipadvantage/en/details.jsp?id=12537




# පර්යේෂණ රුපියල් බවට!

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය**

**මූල්‍ය ප්‍රකාශනය 2022**

**අධ්‍යාපන අමාත්‍යංශය**

## පටුන

පිටු අංකය.


| | | |
|---|---|---|
| 1. | මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 40 |
| 2. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 41 |
| 3. | සමානාත්මතාවයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 42 |
| 4. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 43 |
| 5. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | 44 |
| 6. | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 45-46 |
| 7. | මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම | 47 |

**මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය**
**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන | 2022 (රු.) |
|---|---|---|
| **ආදායම** | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 01 | 12,863,900 |
| ප්‍රදාන වත්කම් මාරු කිරීම් | | 4,885,627 |
| | | 17,749,527 |
| **වියදම්** | | |
| පුද්ගලික වැටුප් ගෙවීම් | 02 | 8,894,495 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 03 | 324,000 |
| ගමන් වියදම් | . | |
| භාවිත කළ සැපයුම් සහ | 04 | 69,973 |
| පරිභෝජන ද්‍රව්‍ය | 05 | 139,140 |
| නඩත්තු වියදම් | 06 | 23,500 |
| කොන්ත්‍රාත් සේවා | 07 | 543,533 |
| ක්ෂයවීම | 08 | 1,148,525 |
| | | 8,020 |
| | | - |
| **අතිරික්තය (Deficit)** | | 6,598,340 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**
**2022 දෙසැම්බර් 31 දින වන විට**

| විස්තරය | සටහන | 2022 (රු.) |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| දේපල යන්ත්‍රාගාර සහ උපකරණ | 08 | 3,737,102 |
| අස්පෘශ්‍ය වත්කම් | 09 | 95,000 |
| | | 3,832,102 |
| **ජංගම වත්කම්** | | |
| පූර්ව ගෙවීම් | 10 | 2,917 |
| මුදල් සහ මුදල් සමානකම් | 11 | 3,200,022 |
| | | 3,202,938 |
| **මුළු වත්කම්** | | **7,035,040** |
| **සාධාරණත්වය සහ වගකීම්** | | |
| **සමකොටස්** | | |
| සමුච්චිත අරමුදල | | 6,598,340 |
| | | 6,598,340 |
| **වත්මන් වගකීම්** | | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 12 | 436,700 |
| | | 436,700 |
| **මුළු වගකීම්** | | **7,035,040** |

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලදි

**මහාචාර්ය අජිත් ද අල්විස්**
ප්‍රධාන නව්‍යකරණ නිලධාරි

**ඩබ් .ඒ .ජී .පී .විජේසිංහ**
ගණකාධිකාරී (වැඩ බලන)

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.
ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් සහ ඒ සඳහා අනුමත කර අත්සන් කරන ලදි

**ඊ .එම් .එස් .බී. ඒකනායක**
සභාපති, NIA හි පාලක සභාව

**එච් .ඩී .සී .එල් .සිල්වා**
සාමාජික, NIA හි පාලක සභාව
සභාපති, NIA හි විගණන සහ
කළමනාකරණ කමිටුව

**සාධාරණත්වයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**
**2022 දෙසැම්බර් 31 දින වන විට**

| | **සමුච්චිත අරමුදල (රු.)** | **එකතුව (රු.)** |
|---|---|---|
| 2022.01.01 දිනට ශේෂය | - | - |
| විවෘත ශේෂ ගැලපීම | | |
| වත්කම් මාරු කිරීම | - | - |
| වසර තුළ අතිරික්ත/හිඟය | 6,598,340 | 6,598,340 |
| පෙර වසර ගැලපීම | - | - |
| ගණුදෙනුව වැටයීම | | |
| 2022.12.31 දිනට ශේෂය | **6,598,340** | **6,598,340** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

| | | 2022 (රු.) |
|---|---|---|
| **වසර සඳහා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය /(හිඟය)** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්ත (හිඟය) | | 6,598,340 |
| **මුදල් නොවන චලනයන් සකස් කිරීම** | | - |
| ක්ෂයවීම | | 1,148,525 |
| රේඛීය අමාත්‍යාංශයෙන් මාරු කරන ලද වත්කම් | - | 4,885,627 |
| | - | 3,737,102 |
| **මෙහෙයුම් අතිරික්තය /(හිඟය) පෙර ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්කම්** | | **2,861,239** |
| ලැබිය යුතු ප්‍රමාණය වැඩි කිරීම/අඩු කිරීම | - | 2,917 |
| වෙනත් ගෙවිය යුතු ගාස්තු වැඩි කිරීම/අඩු කිරීම | | 436,700 |
| | | 433,783 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල්** | | **3,295,022** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය</u> | | |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ/අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | 95,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබුණු / භි යෙදූ ශුද්ධ මුදල්** | **-** | **95,000** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය</u> | | |
| ලැබුණු ප්‍රදාන | | - |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලැබුණු/ භි යෙදූ ශුද්ධ මුදල්** | | **-** |
| මුදල් සහ මුදල් සමතුලිතතාවයේ ශුද්ධ වැඩිවීම/(අඩු වීම). | | 3,200,022 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමානාත්මතාව | | - |
| **වසර අවසානයේදී ශුද්ධ මුදල් සහ මුදල් සමානතා** | | **3,200,022** |

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**01.** සාමාන්‍ය

1.1 ජාතික ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ගිණුම්කරණ සම්මුතිය ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් සකස් කර ඇත.

1.2 පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්
සියලුම ද්‍රව්‍යමය පසු ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලා මූල්‍ය ප්‍රකාශන වල සුදුසු ලෙස ගැලපීමක් හෝ හෙළිදරව් කිරීම් කර ඇත.

1.3 සංසන්දනාත්මක තොරතුරු
2022 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය සඳහා සකස් කළ පළමු මූල්‍ය ප්‍රකාශන වන අතර එම නිසා පෙර වසර සඳහා සැසඳිය හැකි සංඛ්‍යා වත්මන් වසරේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොමැත.

**02. ක්ෂයවීම් ප්‍රතිපත්තිය**

වත්කම් සහ ක්ෂයවීමේ අනුපාත පන්ති පහත පරිදි විය

| **වත්කම්** | **අනුපාතය** |
|---|---|
| 01. පරිගණක සහ උපාංග | 25% |
| 06. විදුලි උපකරණ | 20% |
| 07. ගෘහභාණ්ඩ සහ උපාංග | 20% |
| කාර්යාල උපකරණ | 25% |
| 09. පරිගණක මෘදුකාංග | 25% |

**03. වගකීම් සහ විධිවිධාන**
සියලුම ද්‍රව්‍යමය බැඳීම් සහ හදිසි වගකීම් සලකා බලනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය පරිදි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

**04. මූල්‍ය කාර්ය සාධනය**

4.1. රජයෙන් ලැබෙන පුනරාවර්තන සහ ප්‍රාග්ධන භාණ්ඩාගාර ප්‍රදානයන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සඳහා ගණනය කර ඇත

4.2 වියදම් අධික ආදායමේ හිඟය/ (අතිරික්තය) මූල්‍ය ප්‍රකාශන නෝට්ටු සහ විවාදකයන්හි වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම් සියලු දන්නා සහ ප්‍රමාණාත්මක වගකීම් සඳහා ප්‍රතිපාදන සැපයීමෙන් පසුව ගණනය කර ඇත.

4.3 ප්‍රාග්ධන වත්කම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා දරන සියලුම පිරිවැය සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයට අය කර ඇත.

4.4 කෙටිකාලීන ජීවිතකාල සහිත සහ ස්වභාවයෙන් ද්‍රව්‍ය නොවන ප්‍රාග්ධනීකරණය කළ නොහැකි ඉන්වෙන්ටරි අයිතමවල වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට අය කර ඇත.

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සඳහා සටහන්**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | 2022 (රු.) |
|---|---|
| 01 **භාණ්ඩාගාර ප්‍රතිපාදන** | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - | 10,863,900 |
| පුනරාවර්තන | 2,000,000 |
| | 12,863,900 |
| 02 **පුද්ගලික වැටුප් ගෙවීම්** | |
| වැටුප් හා වේතන | 4,546,625 |
| වෙනත් දීමනා | 2,451,578 |
| EPF දායකත්වය | 736,165 |
| ETF දායකත්වය | 184,041 |
| අතිකාල සහ නිවාඩු වැටුප් | 27,135 |
| CIO දීමනාව | 948,949 |
| | 8,894,495 |
| 03 **අධ්‍යක්ෂ මණ්ඩල දීමනා** | |
| . | 324,000 |
| | 324,000 |
| 04 **ගමන් වියදම්** | |
| ගෘහස්ථ | 69,973 |
| | 69,973 |
| 05 **භාවිත කළ සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය** | |
| ලිපි ද්‍රව්‍ය සහ වෙනත් කාර්යාල අවශ්‍යතා | 50,784 |
| ප්‍රවාහන වියදම් | 77,797 |
| තැපැල් හා සන්නිවේදනය | 4,820 |
| සංග්‍රහ වියදම් | 5,739 |
| | 139,140 |
| 06 **නඩත්තු වියදම්** | |
| පරිගණක නඩත්තුව | 23,500 |
| | 23,500 |
| 07 **කොන්ත්‍රාත් සේවා** | |
| විදුලි සංදේශනය | 511,450 |
| වෙබ් සත්කාරක ගාස්තු | 32,083 |
| | 543,533 |

**2022** දෙසැම්බර් **31** දින වන විට මූල්‍ය **තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්**

08 **දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ**

| | | | පිරිවැය | | |
|---|---|---|---|---|---|
| | 01.01.2022 | මාරු කිරීම් | එකතුකිරීම | බැහැර කිරීම | 31.12.2022 |
| පරිගණක සහ උපාංග | - | 2,948,653 | - | - | 2,948,653 |
| විදුලි උපකරණ | - | 363,360 | - | - | 363,360 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | - | 1,094,271 | - | - | 1,094,271 |
| කාර්යාලයීය උපකරණ | - | 479,343 | - | - | 479,343 |
| | - | 4,885,627 | - | - | 4,885,627 |

| | අනුපාතය | **01.01.2022** | මාරුකිරීම් | ක්ෂයවීම වසර සඳහා | බැහැරකිරීම | **31.12.2022** |
|---|---|---|---|---|---|---|
| පරිගණක සහ උපාංග | 25% | - | - | 737,163 | - | 737,163 |
| විදුලි උපකරණ | 20% | - | - | 72,672 | - | 72,672 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 20% | - | - | 218,854 | - | 218,854 |
| කාර්යාලයීය උපකරණ | 25% | - | - | 119,836 | - | 119,836 |
| | | - | - | 1,148,525 | - | 1,148,525 |
| | | - | | | | 3,737,102 |

09 **අස්පෘශ්‍ය වත්කම්**

| | |
|---|---|
| | 95,000 |
| වෙබ් අඩවිය | 95,000 |

10 **පූර්ව ගෙවීම්**

| | |
|---|---|
| | 2,917 |
| පෙරගෙවුම් වියදම්-ලංකාහොස්ට් | 2,917 |

11 **මුදල් සහ මුදල් සමානකම්**

| | |
|---|---|
| | 3,200,022 |
| මුදල් | 3,200,022 |

12 **වෙනත් ගෙවිය යුතු දෑ**

| | |
|---|---|
| ගෙවිය යුතු EPF | 1,434 |
| ගෙවිය යුතු ETF | 215 |
| Harmony Fund සඳහා ගෙවිය යුතු මුදල | 42,000 |
| UDA වෙත ගෙවිය යුතු | 6,200 |
| සමාජ සේවා අංශයට ගෙවිය යුතු | 4,240 |
| ගෙවිය යුතු අතිකාල දීමනා | 4,047 |
| ගෙවිය යුතු - ශ්‍රී ලංකා ටෙලිකොම් | 30,246 |
| ගෙවිය යුතු APIT | 20,788 |
| ගෙවිය යුතු - පුද්ගල දීමනා | 327,529 |
| | 436,700 |

**මූල්‍ය ප්‍රකාශන වෙත අනාවරණය කිරීම**

**1. දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ**

විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ (COSTI) දැනට පවතින භෞතික සම්පත් රුපියල් 4,885,627 ක් වන අතර එය 2022 ඔක්තෝබර් 26 වන දින ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) වෙත මාරු කරන ලදි. මෙම වත්කම්වල වටිනාකම වත්මන් මූල්‍ය වර්ෂය තුළ දේපල යන්ත්‍රාගාර සහ උපකරණ යටතේ වාර්තා වී ඇත.

**2. අස්පෘශ්‍ය වත්කම්**

NIA සඳහා නිල වෙබ් අඩවිය (www.nia.gov.lk) වසර තුළදී සංවර්ධනය කරන ලද අතර එය අස්පෘශ්‍ය වත්කම් යටතේ වාර්තා කර ඇත.

**3. හුවමාරු නොවන ගනුදෙනුවකින් ලැබෙන ආදායම**

SLPSAS 11 ප්‍රකාරව රේඛීය අමාත්‍යංශයෙන් මාරු කරන ලද වත්කම් සාමාන්‍ය-කාර්ය මූල්‍ය ප්‍රකාශන වල ආදායම් සහ වත්කම් ලෙස පිළිගනු ලබන්නේ මෙම පැවරුමට කිසිදු කාර්ය සාධන බැඳීමක් නොමැති බැවිනි.

**4. පුද්ගලික ගෙවීම්**

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා සහ ප්‍රධාන නව්‍යකරණ නිලධාරී දීමනාව මෙයට ඇතුළත් වේ. 2022 ඔක්තෝබර් 20 දක්වා, ක්‍රියාකාරීව කටයුතු කරන සමස්ත කාර්ය මණ්ඩලයට COSTI වැටුප් පරිමාණය ගෙවන ලද අතර 2022 ඔක්තෝබර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයින් හය දෙනෙකුට ස්ථිර පත්වීම් නිකුත් කරන ලදි. 2022 දෙසැම්බර් මාසයේදී NIA වැටුප් පරිමාණයට අනුව ගණනය කරන ලද හිඟ වැටුප් කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකුට ගෙවන ලදි. ඉතිරි නිලධාරිනියගේ අපේක්ෂිත මුදා හැරීමේ ලිපිය ලැබුණු පසු ඇයට ගෙවිය යුතු හිඟ වැටුප් ද ප්‍රධාන නව්‍යකරණ නිලධාරියාගේ අපේක්ෂිත පත්වීම් දිගුව ලැබුණු පසු ඔහුගේ දෙසැම්බර් දීමනාව ද ගෙවීම සඳහා වත්මන් වසරේ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.

**5. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම්**

2023 ජනවාරි 27 දින, NIA පාලක සභාව විසින්, COSTI හි 2021.12.31 දිනට සිටින කාර්ය මණ්ඩලය සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයට පත් කිරීමේ දිනය 2022.01.01 විය යුතු බවත්, 2023 සඳහා NIA අයවැය ප්‍රතිපාදන ඇත්නම් කාර්ය මණ්ඩලයට හිඟ ගෙවීම් කළ හැකි බවත් තීරණය කර ඇත. 2023 අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම තවම සිදු කර නොමැති බැවින් වත්මන් වර්ෂයේ මූල්‍ය සැලැස්ම තුළ මෙම වගකීම හඳුනාගෙන නොමැත.

2023.01.01 සිට බලපැවැත්වෙන පරිදි අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (APIT) අඩු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මාර්ගෝපදේශයක් නිකුත් කරන ලදි.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | IMT/D/NIA/1/22/87 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි 25 දින |

ප්‍රධාන නවෝත්පාදන නිලධාරි

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

**1.3 නියෝජ්‍යායතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන නියෝජ්‍යායතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

නියෝජ්‍යායතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට නියෝජ්‍යායතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති 2021/01 අංක සහිත මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මුද්‍රණ ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත්කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104 | 2022 වර්ෂය සඳහා සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාවට අනුව එක් ලැප්ටොප් පරිගණකයක් හා යකඩ පුටුවක ඌණතාවයක් දක්වා තිබුණද එයට හේතු සඳහන් කර නොතිබුණු අතර එම නැතිවීම සම්බන්ධ මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු නව නිපැයුම් පිළිබඳ අමාත්‍යාංශය විසින් විද්‍යා තාක්ෂණ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) සතුව පැවති පිරිවැය රු. 4,885,627 ක් වූ මූල්‍ය නොවන වත්කම්2022 ජනවාරි 01 දින නියෝජ්‍යායතනයට ලබා දී තිබුණි. ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 17 ක් වන

අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 11 දෙනෙක් විය. ආයතනයේ කාර්ය මණ්ඩලයට සාපේක්ෂව අතිරික්ත ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක හා පුටු පවතින බවද ඒවා ඌණ උපයෝජිතව පවතින බවද නිරීක්ෂණය විය.

(ආ) මහාභාණ්ඩාගාරය විසින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනය වෙත 2022 වර්ෂය වෙනුවෙන් රු. 12,863,900 ක් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන වලින් රු. 11,151,186 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණද පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා සුදුසු පසුබිමක් මෙතෙක් සකස්කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

| 2.2.2. නිරීක්ෂණ | ප්‍රතිචාර |
|---|---|
| (අ ) වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමග ඉදිරිපත් කර නො තිබුණි. | එකඟ වේ. වාර්ෂික වාර්තා මඟින් ප්‍රධාන ලෙස ආයතනයෙහි කාර්යසාධනය ඉදිරිපත් කෙරෙන අතර 2022 වර්ෂය ආයතනය මෙහෙයුම් ආරම්භ කළ ප්‍රථම වර්ෂය යි. එම වර්ෂය තුළ දී ආයතනය ස්ථිර ලෙස ස්ථාපනය කිරීම සම්බන්ධ පරිපාලන කටයුතු කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට සිදු විය. ආයතනයේ පාලනයෙන් පරිබාහිර එම කටයුතු, එම වර්ෂයේ රට තුළ පැවැති ව්‍යාකූල තත්ත්වය හේතුවෙන් අධික ලෙස ප්‍රමාද වූ බව ඔබේ අවධානයට යොමු කරවමි. කෙසේ වෙතත් හැකි ඉක්මනින් 2022 වාර්තාව ඉදිරිපත් කිරීමට හා 2023 වර්ෂයේ සිට ඉදිරියට නියමිත පරිදි වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. |
| (ආ) 2022 වර්ෂය සඳහා සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාවට අනුව එක් ලැප්ටොප් පරිගණකයක් හා යකඩ පුටුවක ඌනතාවයක් දක්වා තිබුණ ද එයට හේතු සඳහන් කර නොතිබුණු අතර එම නැතිවීම් සම්බන්ධ මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කර නොතිබුණි. | එකඟ නොවේ. එම ඌනතාවයන් COSTI ආයතනයේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් අනාවරණය වූ අතර ඊට අදාළ පැහැදිලි කිරීම් 2021.02.22 දින COSTI විසින් අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත ලබා දී ඇත. අදාල ලිපියේ පිටපත් 2023 මැයි 22 දින ජාතික විගණන කාර්යාලයය වෙත ලබා දී ඇත. තවද, 2013 මැයි මස 19 දින ජාතික විගණන කාර්යාලයයේ නිලධාරිනියකගේ ද නිරීක්ෂණ සහභාගිත්වය සහිතව පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී තහවුරු වූ හා තීරණය කළ පරිදි එම නැතිවීම් COSTI ආයතනයේ වගකීම් වන අතර, COSTI ආයතනය ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය ලෙස පරිවර්තනය කර ස්ථාපිත වීමේ දී, අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව, COSTI ආයතනය සතු සම්පත් (මානව, මූල්‍ය හා භෞතික) විනා වගකීම් භාර ගැනීමක් සිදු නො විණ. එබැවින් මින් ඉදිරියට ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය ඒ සම්බන්ධයෙන් වගකීම භාර නො ගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ. (අදාළ කමිටු රැස්වීමේ වාර්තාවක් එම නිලධාරිනිය වෙත ලබා දී ඇත). |
| **2.3 වෙනත් කරුණු** | ප්‍රතිචාර |
| (අ) නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු නව නිපැයුම් පිළිබඳ අමාත්‍යාංශය විසින් විද්‍යා තාක්ෂණ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයය (COSTI) සතුව පැවති පිරිවැය රු. 4,885,627 ක් වූ මූල්‍ය නොවන වත්කම් 2022 ජනවාරි 01 දින නියෝජ්‍යායතනයට ලබා දී තිබුණි. ආයතනයේ අනුමත කාර්යය | <u>ඌන උපයෝජනය: Laptop පරිගණක හා Desktop පරිගණක</u><br><br>එකඟ වේ.COSTI සතුව Laptop පරිගණක යන්ත්‍ර 56 ක් පැවැතිණි. ඉන් 13 ක් 2019.03.29 වන දින අමාත්‍යාංශය වෙත නැවත භාරදී ඇති අතර තවත් Laptop 17 ක් 2022.10.13 වන දින අමාත්‍යාංශය වෙත භාර දීමට කටයුතු කර ඇත. ඉතිරි Laptop 26 න් 13 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර වර්තමානයේ වෙළෙඳපොල මිල ගණන් අනුව පරිගණක කොටස් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීමත් පවත්නා අයවැය ප්‍රතිපාදන තුළ එම මුදල කළමනාකරණය කර ගැනීමට නොහැකි වීමත් මත අලුත්වැඩියා කිරීම අත්හිටුවා ඇත.<br><br>කෙසේ වෙතත් පුරප්පාඩු පවත්නා තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට ඉල්ලීම් සිදු කර ඇති අතර ඒ අනුව අලුත්වැඩියා කර නැවත භාවිත කළ හැකි පරිගණක පවතී නම් ඒවා අදාළ නිලධාරීන්ට ලබා දීමට |

| | |
|---|---|
| මණ්ඩලය 17 ක් වන අතර, තත්‍ය කාර්යය මණ්ඩලය 11 දෙනෙක් විය. ආයතනයේ කාර්යය මණ්ඩලයට සාපේක්ෂව අතිරික්ත ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක හා පුටු පවතින බව ද ඒවා ඌන උපයෝජිතව පවතින බව ද නිරීක්ෂණය විය. | අදහස් කරන අතර ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ අදාල ක්‍රමවේද අනුගමනය කරමින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br><u>ඌන උපයෝජනය: පුටු</u><br><br>එකඟ නොවේ. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) ලෙස පරිවර්තනය කර, ස්ථිර ආයතනයක් ලෙස ස්ථාපනය කරන ලද්දේ මීට පෙර පැවැති COSTI ආයතනය ම වේ. (COSTI සතුව පැවැති මානව, මූල්‍ය හා භෞතික සම්පත් NIA පිහිටුවීමේ දී භාවිත කළ යුතු බවට නියෝග කර ඇති කැබිනට් පත්‍රිකාවේ සහ අනුමැතියේ පිටපත් 2023 මැයි 22 දින ජාතික විගණන කාර්යාලයය වෙත ලබා දී ඇත). COSTI ආයතනයේ කාර්යය මණ්ඩලය 41 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් සඳහා අවශ්‍ය මේස හා පුටු ද, ඊට අමතරව එය සතුව රැස්වීම් මේසයක් සහ ඊට අවශ්‍ය පුටු ද පැවැතිණි. COSTI ආයතනය, NIA ලෙස පරිවර්තනය කිරීමේදී එම 41 ක කාර්යය මණ්ඩල සංඛ්‍යාව ම අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරුණ ද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද්දේ 2021 වර්ෂය වන විට COSTI හි සේවය කරමින් සිටි සේවක සංඛ්‍යාවට සමාන කාර්යය මණ්ඩලයක් පමණි. එහෙත්, COSTI ලෙස පවතිද්දී තිබුණාට වඩා NIA හි වගකීම් සහ සේවා ක්ෂේත්‍රය පුළුල් වී ඇති බැවින් නුදුරු අනාගතයේ දී ම, පෙර පරිදි 41 කින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත කාර්යය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට NIA අපේක්ෂා කරයි. ඒ අනුව ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබා දීමට සිදුවන්නේ දැනට NIA සතුව පවතින පුටු ම වනු ඇත. එවිට රජයට අමතර මුදලක් වැය කිරීමට අවශ්‍ය නොවන බැවිණි.<br><br>තවද, NIA යනු බාහිර පුද්ගලයන් හා නව්‍යකරණ ක්‍රියාවලියේ නියුතු වන්නන් නිතර පැමිණෙන ආයතනයක් බැවින්, ඒ අය සමග රැස්වීම්, සාකච්ඡා ආදිය පැවැත්වීම අත්‍යවශ්‍ය වේ. සමහර අවස්ථාවල දී සමාන්තර සාකච්ඡා කිහිපයක් එකවර පැවැත්වීම ද සිදු වේ. එහිදී, අංක 7 හි සඳහන් පුටු භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.<br><br>එබැවින්, COSTI සතුව පැවැති පුටු NIA වෙත අතිරික්තයක් ලෙස හා ඌන-උපයෝජිතව පවතී යැයි සැලකීම හා එකඟ විය නො හැකිය. |
| (ආ) මහාභාණ්ඩාගාරය විසින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය වෙත 2022 වර්ෂය වෙනුවෙන් රු. 12,863,900 ක් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන වලින් රු. 11,151,186 ක් 2022 දෙසැම්බර් 31 දින | එකඟ නොවේ. ආයතනය නිල වශයෙන් ආරම්භ වූ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් ක්‍රියාකාරකම් සියල්ල පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ඒවා වේ. එම ක්‍රියාකාරකම් සියල්ල, 2022 වර්ෂය සඳහා අනුමත ක්‍රියා සැලැස්මට අනුකූලව ම සිදු කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ. |

| | |
|---|---|
| වන විට වැය කර තිබුණ ද පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා සුදුසු පසුබිමක් මෙතෙක් සකස්කර නොතිබුණි. | |

<u>සටහන</u>

කෙසේ වෙතත් සමස්තයක් වශයෙන් 2022 මූල්‍ය ප්‍රකාශන මත ඔබ විසින් ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණයන් ගැඹුරින් අධ්‍යනය කළ අතර එසේ පෙන්වා දී ඇති සහ මෙම ආයතනයෙන් එකඟවූ කරුණු සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග (Corrective Measures) හා ඒවා නැවත ඇති නොවන ලෙස වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග (Preventive Measures) ගැනීමට සටහන් කර ගනිමින් අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.